වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2022



ජනාධිපති කාර්යාලය

2022 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව

ආයතනයේ නම : ජනාධිපති කාර්යාලය

වැය ශීර්ෂ අංකය : 01

පටුන

අන්තර්ගතය			පිටු අංකය
01 පරිච්ඡේදය	-	ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය	2
02 පරිච්ඡේදය	-	2022 ප්‍රගතිය හා 2023 ඉදිරි දැක්ම	5
03 පරිච්ඡේදය	-	2022 වසර සඳහා සමස්ත මූල්‍ය කාර්යසාධනය	27
		විගණකාධිපති නිරීක්ෂණ	32
04 පරිච්ඡේදය	-	කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)	41
05 පරිච්ඡේදය	-	තිරසර සංවර්ධන අරමුණු සපුරාගැනීමේ කාර්යසාධනය	50
06 පරිච්ඡේදය	-	මානව සම්පත් පැතිකඩ	52
07 පරිච්ඡේදය	-	අනුකූලතා වාර්තාව	54

01 පරිච්ඡේදය

ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

දැක්ම

"වසර 2048 දී පූර්ණ සංවර්ධිත ශ්‍රී ලංකාවක්"

මෙහෙවර

සංවර්ධිත ශ්‍රී ලංකාවක් ගොඩනැංවීම උදෙසා වන සියලු අරමුණු සහ ඉලක්ක කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ඉටුකර ගැනීම පිණිස නිවැරදි දිශානතියක් කරා රාජ්‍යය යොමුකිරීම

අරමුණු

i. ගරු ජනාධිපතිතුමන්ගේ දැක්ම යථාර්ථයක් බවට පත්කරලීම සඳහා වඩාත් සඵලදායීව, කාර්යක්ෂමව හා සක්‍රිය ලෙස දායක වීම.

ii. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හා විවිධ අණපනත් මගින් ගරු ජනාධිපතිතුමන් විසින් ක්‍රියාත්මක කළයුතු බවට සඳහන් කාර්යයන් එම නීත්‍යානුකූල ප්‍රතිපාදන වලට අනුකූලව කාර්යක්ෂමව හා අනලස්ව ඉටුකිරීම සඳහා සහාය වීම.

iii. ජනාධිපති කාර්යාලය විසින් ඉටුකරන නියාමන හා සම්බන්ධීකරණ කාර්යයන් ඵලදායීව දියත් කිරීම සඳහා පියවර ගැනීම.

iv. අමාත්‍යාංශ හා විවිධ අංශ වලට අයත් සංවර්ධන කාර්යයන් සම්බන්ධීකරණය කිරීම හා අවශ්‍ය පරිදි පහසුකම් සැපයීම.

v. ජනාධිපති කාර්යාලයට අදාළ සියළු කළමනාකරණ ශ්‍රිත සමෝධානයක් සහිතව දියත් කිරීම.

vi. පරිපාලන අවභාවිතාවන්, අතපසු වීම් හෝ ප්‍රමාදයන් නිසා සිදුවී ඇති මහජන පීඩා/ගැටළු අවම කිරීම.

vii. දිළිඳුබව තුරන් කිරීම හා සංවර්ධන ගැටළු සඳහා අවශ්‍ය උපායමාර්ගික මැදිහත්වීම් සිදුකිරීම.

viii. යාවත්කාලීන දත්ත ප්‍රවේශයක් ඇති කිරීම තුළින් ප්‍රජාව වෙත ප්‍රතිලාභ සැලසීම කාර්යක්ෂමව සිදු කිරීම.

ix. වඩා ඵලදායී අයුරින් රාජ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක වීම සඳහා දායක වීම තුලින් ප්‍රජාව වෙත ප්‍රතිලාභ සැලසීමේ ඉඩ ප්‍රස්තා වැඩි කිරීම.

x. මහජන සුඛසාධනය සහතික කිරීම.

1.4 සංවිධාන සටහන


ගරු ජනාධිපතිතුමා
ජනාධිපති ලේකම්
කාර්යය මණ්ඩල ප්‍රධානී / ජනිත ආරක්ෂක උපදේශක
ජනාධිපති උපදේශකවරු
1 කාර්යය මණ්ඩල ප්‍රධානී අංශය අධ්‍යක්ෂ ජනරාල්
2 ජනාධිපති පෞද්ගලික ලේකම් කාර්යාලය
3 විශේෂ ව්‍යාපෘති අංශය අධ්‍යක්ෂ ජනරාල්
4 ජනාධිපති ලේකම් කාර්යාංශය අතිරේක ලේකම්
5 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා හා ව්‍යවස්ථාපිත කටයුතු අංශය අතිරේක ලේකම්
6 ක්‍රමෝපායික කටයුතු අංශය ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම්
7 ආර්ථික කටයුතු අංශය අතිරේක ලේකම්
8 ආහාර සුරක්ෂිතතා හා යටිතල පහසුකම් ව්‍යාපෘති සංවර්ධන අංශය
9 ආයතන සම්බන්ධීකරණ අංශය අතිරේක ලේකම්
10 කෘෂිකර්මී ඵලදායිතා සහ පරිසර අංශය අතිරේක ලේකම්
11 පාර්ලිමේන්තු හා අමාත්‍ය මණ්ඩල කටයුතු අංශය අතිරේක ලේකම්
12 මාධ්‍ය සම්බන්ධතා අංශය අධ්‍යක්ෂ ජනරාල්
13 ජනාධිපති අරමුදල් ලේකම්
14 නීති කටයුතු අංශය ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම්
15 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහ ඩිජිටල්කරණ අංශය අතිරේක ලේකම්
16 මානව සම්පත්, පංගන හා ප්‍රවාහන අංශය ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම්
17 ගිණුම් හා මූල්‍ය අංශය ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම්
18 ජනාධිපති මාධ්‍ය අංශය අධ්‍යක්ෂ ජනරාල්
19 අභ්‍යන්තර විගණන අංශය අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
20 උතුරු පළාත් සම්බන්ධීකරණ අංශය අතිරේක ලේකම්
21 ඔම්බුඩස්මන් - ජනාධිපති කාර්යාලය
22 ආර්ථික ස්ථායීකරණ ඒකකය ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම්
23 සංවර්ධන සම්බන්ධීකරණ අංශය ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම්
24 ජනාධිපති මාධ්‍ය අංශය අධ්‍යක්ෂ ජනරාල්
25 ජනාධිපති වෘත්තීය සමිති සම්බන්ධතා අංශය අධ්‍යක්ෂ ජනරාල්

1.5 ජනාධිපති කාර්යාලය යටතේ පවතින ප්‍රධාන අංශ

1) කාර්යය මණ්ඩල ප්‍රධානී අංශය
2) ජනාධිපති පෞද්ගලික ලේකම් කාර්යාලය
3) ජනාධිපති ලේකම් කාර්යාංශය
4) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා හා ව්‍යවස්ථාපිත කටයුතු අංශය
5) පාර්ලිමේන්තු හා අමාත්‍ය මණ්ඩල කටයුතු අංශය
6) මානව සම්පත්, පාලන හා ප්‍රවාහන අංශය
7) ආර්ථික කටයුතු අංශය
8) ක්‍රමෝපායික කටයුතු අංශය
9) ආහාර සුරක්ෂිතතා හා යටිතල පහසුකම් ව්‍යාපෘති සංවර්ධන අංශය
10) කෘෂිකර්ම ඵලදායිතා සහ පරිසර අංශය
11) ආයතන සම්බන්ධීකරණ අංශය
12) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහ ඩිජිටල්කරණ අංශය
13) අභ්‍යන්තර විගණන අංශය
14) උතුරු පළාත් සම්බන්ධීකරණ අංශය
15) ප්‍රජා කටයුතු අංශය
16) ගිණුම් හා මූල්‍ය අංශය
17) සංවර්ධන සම්බන්ධීකරණ අංශය
18) ආර්ථික ස්ථායීකරණ අංශය
19) නීති කටයුතු අංශය
20) ජනාධිපති මාධ්‍ය අංශය
21) විශේෂ ව්‍යාපෘති අංශය
22) මහජන සම්බන්ධතා අංශය
23) ජනාධිපති වෘත්තීය සමිති සම්බන්ධතා අංශය
24) ඔම්බුඩ්ස්මන් කාර්යාලය
25) ජනාධිපති අරමුදල

1.6 ජනාධිපති කාර්යාලය යටතේ පවතින අරමුදල්

- ජනාධිපති අරමුදල
- කොවිඩ් - 19 සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණ අරමුදල (2022.10.28 දින සිට අවසන් කරන ලදි)

02 පරිච්ඡේදය

2022 ප්‍රගතිය හා 2023 ඉදිරි දැක්ම

2.1 ප්‍රගතිය 2022

2.1.1 ප්‍රතිපත්තිමය මඟපෙන්වීම්

2019-2020 කාලසීමාවේ ලෝකය පුරා ව්‍යාප්ත වූ කොවිඩ්-19 වසංගත රෝග ව්‍යාප්තිය හා ඉන් පසුව ඇති වූ ගෝලීය ආර්ථික අර්බුදය, ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳාම හා සම්බන්ධ ජංගම ගිණුමේ මෙන්ම අයවැය අංශයේ හිඟයක් නිර්මාණය කිරීමටත්, එය දරුණු ආර්ථික පසුබෑමක් දක්වා වර්ධනය කිරීමටත් සමත් විය. ආර්ථික වර්ධන වේගය 2022 පළමු කාර්තුව වන විට -0.5%ක් දක්වා පහත වැටුනු අතර ජාතික පාරිභෝගික මිල දර්ශකය අනුව ගණන් බැලූ උද්ධමනය එම වකවානුව වන විට 21.5%ක් දක්වා වර්ධනය විය. ඒ සමග බැඳුනු අත්‍යවශ්‍ය භාණ්ඩ හිඟය විසින් සිවිල් සමාජයේ සාමාන්‍ය පැවැත්මට බරපතල බාධා ඇති විය. 2022 දෙසැම්බර් වන විට ආර්ථික වර්ධන වේගය -7.8% ක් දක්වා සංකෝචනය වූ අතර උද්ධමනය 59.2% ක් දක්වා වර්ධනය විය.

2022 අගෝස්තු මස වන විට පැවති අර්බුදකාරී තත්ත්වය කඩිනමින් සමනය කිරීම හා ආර්ථිකය නැවත නගා සිටුවීම සඳහා වත්මන් ජනාධිපතිවරයා විසින් කෙටිකාලීන, මධ්‍යකාලීන හා දිගුකාලීන සැලසුම් උපායමාර්ග වලින් සැදුම්ලත් ප්‍රතිපත්ති මාලාවක් දියත් කිරීම ආරම්භ කරන ලදී. එම ප්‍රතිපත්ති මාලාවෙහි පහත සඳහන් සිව්-වැදෑරුම් ප්‍රවේශයන් අන්තර්ගත විය;

1) සාර්ව ආර්ථික ස්ථාවරත්වය යථා තත්ත්වයට පත් කිරීම
2) සුරක්ෂිත රටක් ගොඩනැගීම
3) පුරවැසියන් වෙත ඵලදායී ලෙස ප්‍රවේශ වීම
4) ආයතනික ප්‍රතිව්‍යුහගතකරණය

1) සාර්ව ආර්ථික ස්ථාවරත්වය යථා තත්ත්වයට පත් කිරීම

ආර්ථිකය ස්ථාවර කරගැනීමේ කාර්යයේදී, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහාය ලබාගැනීම, බාහිර සහයෝගය බලමුළු ගැන්වීම, ණය ප්‍රති-ව්‍යුහගතකරණය, විදේශ විනිමය ද්‍රවශීලතාවය පවත්වා ගැනීම හා අත්‍යවශ්‍ය ආනයන වෙනුවෙන් සේතු මූල්‍ය පහසුකම් සපයාගැනීම යන අංශවලින් මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය හා ශ්‍රී ලංකා මහ බැංකුව ඇතුළු ආයතන සමග ඒකාබද්ධව ජනාධිපති කාර්යාලය අඛණ්ඩව මැදිහත් වීම් කරන ලදී.

- ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග සාකච්ඡා මුල්වරට ආරම්භ කරන ලද්දේ හිටපු ජනාධිපතිවරයා යටතේ 2022 වසර ආරම්භයේදීය. වත්මන් ජනාධිපතිවරයා යටතේ, එක්සත් ජනපද ඩොලර් බිලියන 2.9 ක පමණ විස්තීරණ ණය පහසුකම (Extended Fund Facility / EFF) මාස 48 ක විධිවිධානයක් සඳහා, ශ්‍රී ලංකාව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ නිලධාරී මට්ටමේ එකඟතාවයකට එළැඹුණේ 2022 සැප්තැම්බර් මස මුලදීය.

- විදේශ ණය සේවා ගෙවීම් සහ සේවාකරණය සඳහා ද්‍රවශීල විදේශ සංචිත ප්‍රමාණවත් නොවීම සැලකිල්ලට ගනිමින්, රජය විසින් 2022 අප්‍රේල් 12 වැනි දින, රජයේ විදේශ ණය ප්‍රතිව්‍යුහගත කිරීම අවසන් වන තෙක් තෝරාගත් විදේශ ණය සේවා ගෙවීම් තාවකාලිකව අත්හිටුවන බව නිවේදනය කරන ලදී. පසුව, ශ්‍රී ලංකාවේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියට අදාළව ඉන්දියාව, චීනය, සහ පැරිස් සමාජය (Paris Club) ඇතුළු නිල ණය හිමියන් සමඟ පවත්වන ලද සාකච්ඡා 2022 වසර අවසන් වන විට අපේක්ෂිත ඉලක්ක වෙත සාර්ථකව මෙහෙයවීමට හැකියාව ලැබුණි.

- විදේශ විනිමය ගලා ඒම දුර්වල වීම සහ අත්‍යවශ්‍ය ආනයන සඳහා අර්ධ වශයෙන් මූල්‍යකරණය කිරීම පිණිස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අඛණ්ඩව විදේශ විනිමය සැපයීම හේතුවෙන්, දළ නිල සංචිත තීරණාත්මක ලෙස පහළ යමින් තිබුණි.

එ.ජ.ඩො. බිලියන

	2021	2022
දළ නිල සංචිත	3.14	1.90
අපනයන ඉපැයීම්	12.50	13.11
විදේශගත ශ්‍රමිකයන්ගේ ප්‍රේෂණ	5.49	3.79
සංචාරක ඉපැයීම්	0.51	1.14
වෙළඳ හිඟය	8.14	5.19

අපනයන ඉපැයීම්වල වැඩිවීමට සාපේක්ෂව ආනයන වියදම් කැපී පෙනෙන ලෙස අඩුවීම, ආනයන යෙදවුම් අවම කරන ලද අපනයන ඉපැයුම් ක්‍රියාවලියක් ඇති කිරීම සහ විදේශගත ශ්‍රමිකයන්ගේ ප්‍රේෂණ වැඩි වීම වැනි කරුණු හේතුවෙන්, වෙළඳ හිඟයෙහි පටු වීමකට ලක් විය. ඒ අනුව, 2022 ඔක්තෝබර් මස වන විට එ.ජ.ඩොලර් මිලියන 1,705ක අවමයක් දක්වා අඛණ්ඩව පහත වැටුනු නිල විදේශ සංචිත, 2022 දෙසැම්බර් මස අවසානය වන විට නැවතත් ස්ථාවර ලෙස ගොඩනගමින් එ.ජ.ඩොලර් මිලියන 1,898ක් දක්වා වර්ධනය කර ගත හැකිවිය.

- එමෙන්ම, විදේශගත ශ්‍රී ලාංකික වෘත්තිකයින් විසින් එවනු ලබන ප්‍රේෂණ, බැංකු පද්ධතිය හරහා ලංකාවට එවීම දිරිමත් කරලීමට ගත් පියවර හේතුවෙන් 2022 වසර තුළ එකී ප්‍රේෂණ වල වටිනාකම ද වර්ධනය කර ගැනීමට සමත් විය.

- රටෙහි විදේශ විනිමය සංචිත වර්ධනය කිරීම සඳහා අතිශයින් වැදගත් වූ සංචාරක කර්මාන්තය තුළ පිබිදීමක් ඇති කිරීමටත් රජය සමත් විය. ගරු ජනාධිපතිතුමාගේ මාර්ගෝපදේශ අනුව, රජය විසින් ක්‍රියාත්මක කළ සංචාරක ප්‍රවර්ධන වැඩසටහන හේතුවෙන් 2022 වසර තුළ මෙරටට පැමිණි සංචාරකයින් සංඛ්‍යාව 719,978ක් වන අතර, එය පෙර වර්ෂයේ පැමිණි විදෙස් සංචාරකයින් සංඛ්‍යාව වන 194,495 ක ප්‍රමාණය සමග සංසන්දනය කිරීමේ දී 270%ක ඉහළ යාමකි. එමගින් රැස්කර ගත හැකිවූ විදේශ විනිමය ප්‍රාථමික ගිණුමේ ශේෂය අවම කිරීම සඳහා වැදගත් දායකත්වයක් දක්වා ඇත. විශේෂයෙන්ම, මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපළ 2022 දෙසැම්බර් මස සිට මොස්කව් ඇතුළු යුරෝපීය ගමනාන්ත වෙත සම්බන්ධ කිරීම ආරම්භ කිරීමත් සමග සංචාරකයන් ආකර්ෂණය සඳහා නව අවස්ථා නිර්මාණය වී ඇත.

ඉහත සියළු මැදිහත්වීම් වල ප්‍රතිඵලයක් ලෙස, ශ්‍රී ලංකා ආර්ථිකය, 2022 වසරේ සිව්වැනි කාර්තුව වන විට කිසියම් ස්ථාවරභාවයකට පත්කර ගැනීමට හැකියාව ලැබුණි. විශේෂයෙන්ම, ඉන්ධන, පොහොර, ගෑස් හා ඖෂධ යන අත්‍යවශ්‍ය සැපයුම් කළමනාකරණය කිරීම සඳහා කරන ලද ප්‍රතිපත්තිමය මැදිහත් වීම හේතුවෙන්, රටතුළ ජන ජීවිතය සාමාන්‍ය තත්ත්වයට පත්වන මට්ටමේ සාර්ථක විසඳුම් ලබාදිය හැකි විය.

- **මිත්‍රශීලී ජාත්‍යන්තර සහයෝගය** - සෑම රටක් සමගම සුහද හා මිත්‍රශීලී විදේශ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම සඳහා රාජ්‍ය යාන්ත්‍රණය හා විදේශ ප්‍රතිපත්තිය දියත් කරන ලදී. 2022 වසර තුළ ලෝක ආර්ථික හා දේශපාලනික පසුබිමෙහි මතුව තිබූ අර්බුදකාරී හා පසුබෑම් හමුවේ පවා සියළු රටවල් අප අත නොහැර යන පරිදි රඳවා තබා ගැනීමට එම විදේශ ප්‍රතිපත්තිය ඉවහල් විය. විශේෂයෙන්ම ආර්ථික අර්බුදයෙන් නැගීසිටීම සඳහා අප දරන ප්‍රයත්නයේ දී, ණය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා අදාළ සියළු රටවල් ධනාත්මක ප්‍රතිචාර දැක්වීමෙන් අපගේ ප්‍රවේශය සාර්ථක වී ඇති බව පැහැදිලිය.

- 2022.01.01 සිට 2022.07.20 දක්වා ජනාධිපති ධුරයේ කටයුතු කළ ගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා විසින් රුසියානු සමූහාණ්ඩුව, ඉරාකය, සෞදි අරාබිය අමෙරිකා එක්සත් ජනපදය, නේපාලය, බංග්ලාදේශය, ඊජිප්තුව, ජපානය, ඉන්දියාව, චීනය, පාකිස්ථානය, දකුණු කොරියාව, ඉරානය, යුරෝපා සංගමය, ඕස්ට්‍රේලියාව, කැනඩාව හා මැද පෙරදිග රටවල් 8ක් සමග රාජ්‍ය තාන්ත්‍රික මට්ටමින් සාකච්ඡා කරමින්, ද්වි-පාර්ශවීය සහයෝගිතාවයන් ප්‍රවර්ධනය කරගැනීම සඳහා සාකච්ඡා පවත්වන ලදී.

- එමෙන්ම, අන්තර්ජාතික සංවර්ධන සංගමය (IDA), අන්තර්ජාතික මූල්‍ය අරමුදලේ (IMF) නියෝජිතයින් හා ආසියානු සංගමයේ (ASEAN) රටවල තානාපතිවරුන් සමග සාකච්ඡා කරමින්, වත්මන් ආර්ථික අර්බුදයට පිළියම් සෙවීම සඳහා බහුපාර්ශ්වික සහයෝගය ඉල්ලා සිටින ලදී.

- 2022.07.21 සිට ජනාධිපති ධුරය හොබවන ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා යටතේ ජාත්‍යන්තර කටයුතු කෙරෙහි වැඩි අවධානයක් යොමුකරන ලදී. ඇමෙරිකා එක්සත් ජනපදයේ ජ්‍යෙෂ්ඨ නියෝජිතයින් විසින් මෙරට වෙත සිදු කරන ලද විශේෂ චාරිකා කිහිපයට අමතරව, එක්සත් ජාතීන්ගේ සංගමය, යුරෝපා සංගමය, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ ලෝක ආහාර වැඩසටහන යන ප්‍රමුඛ පෙළේ බහු පාර්ශවීය සංවිධානවල නියෝජිතයින් වෙත ද ජනාධිපතිවරයා විසින් තම සත්කාරකත්වය දක්වන ලදී. එමෙන්ම, ඉන්දියාව, ජපානය සහ චීනය වැනි සමීප විදේශීය මිත්‍ර රටවල් අතර ජාත්‍යන්තර සබඳතා ශක්තිමත් කර ගැනීම සඳහා ද ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා විසින් පියවර ගෙන ඇත.

- ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වන එක්සත් ජනපද නියෝජිතායතනයේ (USAID) පරිපාලක සමන්තා පවර් මහත්මිය, 2022 සැප්තැම්බර් මස 11 වෙනි දින පැවති සාකච්ඡාවේදී, ආර්ථික අර්බුදය මෙන් ම දේශපාලන ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් වත්මන් ජනාධිපතිවරයා සහ රජය විසින් ගෙන ඇති පියවර ඇගයීමට ලක් කරන ලදී. ආර්ථික අර්බුදයට පිළියමක් වශයෙන් සහ ආහාර හිඟතාවය වෙනුවෙන්, USAID විසින් ලබා දෙනු ලබන සහාය තව දුරටත් ශක්තිමත් කිරීමට ඇය විසින් අවධානය යොමුකරන ලදී.

2) සුරක්ෂිත රටක් ගොඩනැගීම

ආහාර සුරක්ෂිතතාවය

- ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීම සඳහා ජනාධිපති කාර්යාලය විසින් 2022 ජූලි මස 23 වන දින ආහාර සුරක්ෂිතතා අංශයක් ස්ථාපනය කිරීමට පියවර ගන්නා ලදී. එම අංශය විසින් බහු ආංශික හවුල්කාරිත්වයක් සහිතව, රට පුරා ගෙයින් ගෙට ව්‍යාපාරයක් ද දියත් කරමින් ආහාර සුරක්ෂිතතාවය සහතික කිරීම සඳහා පුළුල් බහු ආංශික ඒකාබද්ධ යාන්ත්‍රණයක් දියත් කරන ලදී.

- එම බහු ආංශික ඒකාබද්ධ යාන්ත්‍රණය අනුව, කෘෂිකර්ම අංශයේ සියලු යෙදවුම් හා නිෂ්පාදන ක්‍රියාවලි සම්බන්ධ සැලසුම් සමාලෝචනය කරමින් අනුමත කිරීම සඳහා පුළුල් සහභාගීත්වයක් සහිතව කටයුතු කිරීමත් ජාතික, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ආහාර සුරක්ෂිතතා සහ පෝෂණ සැලසුම් සකස් කිරීමටත්, ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් ගම් 14,022 ක ආර්ථික පුනර්ජීවන සැලසුම් පිළියෙළ කිරීමටත් පියවර ගන්නා ලදී. හඳුන්වාදුන් බහු ආංශික ඒකාබද්ධ යාන්ත්‍රණය හේතුවෙන් සමස්ත ආහාර නිෂ්පාදන ක්‍රියාවලිය කිසියම් සංවිධිත තත්ත්වයකට පත්කර ගැනීමට හැකි වූ අතර ආහාර ක්ෂේත්‍රයේ අර්බුදකාරී තත්ත්වයක් නිර්මාණය වීමට තිබූ ඉඩකඩ බොහෝ සෙයින් අවම කරගැනීමට ද හැකිවිය.

- එමෙන්ම, බහු ආංශික ඒකාබද්ධ යාන්ත්‍රණය මගින් ලෝක ආහාර වැඩසටහන , ලෝක බැංකුව සහ ආසියානු සංවර්ධන බැංකුව තුළින් සපයා ගත් විශේෂ සහාය සහිතව උග්‍ර ආහාර අනාරක්ෂිතතාවයට පත්ව සිටි පවුල් 61,000ක් සඳහා මුදල් ප්‍රදාන හා වියළි සලාක ලබාදීමට පියවර ගන්නා ලදී. ජාතික සෞඛ්‍ය කාර්යාංශය විසින් හඳුනාගත් උග්‍ර මන්දපෝෂණයෙන් පෙළෙන දරුවන් 4,000ක් සඳහා උපකාර කිරීම පිණිස, පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුවේ සහ සෞඛ්‍ය අමාත්‍යාංශයේ හවුල්කාරිත්වයෙන් කැපකරු මාපිය යෝජනා ක්‍රමයක් ද හඳුන්වා දෙන ලදී.

- දේශීය රාජ්‍ය නොවන සංවිධාන වල සහයෝගය ඇතිව ගෙවතු මිලියනයක් සංවර්ධනය කිරීමේ වැඩසටහනක් දියත් කරන ලද්දේ ද මෙම ක්‍රියාවලියට සහායක අත්වැලක් වශයෙනි. ළමුන් අතර ඌණ පෝෂණය තුරන් කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය, පළාත් පාලන බලධාරීන් සහ පෞද්ගලික පරිත්‍යාගශීලීන් සම්බන්ධීකරණය කරමින් සියලුම ප්‍රාථමික පාසල් සඳහා දිවා ආහාරය ලබා දීමේ වැඩසටහනක් ප්‍රවර්ධනය කරන ලදී. සිසුන් මිලියන 1.08 ක් ඉලක්ක කරමින් පාසල් 7,926 ක් තුළ ආරම්භ කරන ලද වැඩසටහන පුද්ගලික ප්‍රදාන යොදාගනිමින් තවත් පාසල් සිසුන් මිලියනයකට පමණ ප්‍රතිලාභ අත්කර දීමට හැකිවන පරිදි පුළුල් කිරීමට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සහිතව ගරු ජනාධිපතිතුමා විසින් පියවර ගත්තේ 2022 ඔක්තෝබර් මස සිට ක්‍රියාත්මක වන පරිදිය.

- 2022 මහ කන්නය සඳහා අවශ්‍ය පොහොර, කෘෂි රසායනික ද්‍රව්‍ය, බීජ සහ ඉන්ධන ලබා දීම පෞද්ගලික අංශය සමඟ ඒකාබද්ධව සිදුකිරීමටත්, වී වගාව සඳහා පමණක් රජය විසින් පොහොර සැපයීමටත්, එකී පොහොර අවශ්‍යතාවයෙන් 70%ක් රසායනික පොහොර වලින් හා 30%ක් කාබනික පොහොර වලින් සැපයීමටත් රජය විසින් පියවර ගන්නා ලදී.

- වී වගාව සඳහා අවශ්‍ය යූරියා පොහොර මෙ.ටො. 141,542ක්, ට්‍රිපල් සුපර් ෆොස්ෆේට් (TSP) මෙ.ටො. 37,428 ක්, සහ මියුරේට් ඔෆ් පොටෑෂ් (MOP) මෙ.ටො. 6,674ක් විදේශීය ණය ආධාර යටතේ නියමිත කාලසීමාව තුළ සැපයීම සඳහා ජනාධිපති කාර්යාලය මැදිහත් වන ලදී. ඒ අනුව, ලෝක බැංකුව (WB) විසින් එ.ජ.ඩොලර් මිලියන110ක වටිනාකමකින් යුත් යූරියා මෙ.ටො. 150,000ක්ද, ආසියානු සංවර්ධන බැංකුව (ADB) විසින් එ.ජ.ඩොලර් මිලියන 40ක් වටිනා MOP මෙ.ටො. 36,000 ක් ද, ආහාර සහ කෘෂිකර්ම සංවිධානය (FAO) විසින් එ.ජ.ඩොලර් මිලියන 13.5ක් වටිනා යූරියා මෙ.ටො. 18,000 ක් ද, ඉන්දියානු එක්සිම් බැංකුව විසින් එ.ජ.ඩොලර් මිලියන 65.0ක් වටිනා යූරියා මෙ.ටො. 65,000 ක් ද සපයන ලදී.

- ආහාර නිෂ්පාදන දාමයේ ඉතා වැදගත් කාර්යභාරයක් ඉටුකරන බඩඉරිඟු වගාව සඳහා අවශ්‍ය යූරියා මෙ.ටො. 12,000 ක් 2022 ඔක්තෝබර් මාසය තුළත්, මියුරේට් ඔෆ් පොටෑෂ් අවශ්‍යතාවය නොවැම්බර් මාසය තුළත් ගොවිජන සේවා මධ්‍යස්ථාන හරහා බෙදාහැරීම මඟින් මහ කන්නයේ පොහොර අවශ්‍යතාවය සම්පූර්ණ කිරීමට පියවර ගන්නා ලදී. තවද, වෙළඳපොලේ යූරියා කි.ග්‍රෑ.50ක බෑගයක රු:39,000.00 කටත්, තේ, එළවළු හා වෙනත් වගාවන් සඳහා අවශ්‍ය මිශ්‍ර පොහොර කි.ග්‍රෑ.50 ක බෑගයක් රු.17,000.00 මිලකට ප්‍රමාණවත් පරිදි පෞද්ගලික අංශයෙන් මිල දී ගැනීමට හැකියාව ස්ථාපිත කරන ලදී. එමෙන්ම, තේ සහ එළවළු සඳහා අවශ්‍ය යූරියා කි.ග්‍රෑ. 50 ක බෑගයක් රු. 17,000.00 මිලකට ලබා ගැනීමට හැකි තත්ත්වයක් නිර්මාණය කරන ලදී.

- 2022 මහ කන්නය සඳහා අවශ්‍ය කෘෂිරසායන ආනයනය කිරීම සඳහා සමස්තයක් ලෙස එ.ජ.ඩොලර් මිලියන 53ක විදේශ විනිමය සපයා දීමට මහ බැංකුව විසින් අවශ්‍ය පියවර ගන්නා ලදී. රජය විසින් පනවා තිබූ ආනයන සීමා ලිහිල් කරන ලද අතර ටෙලිග්‍රැෆික් හුවමාරු සීමාවන් එ.ජ.ඩොලර් 50,000 සිට 250,000 දක්වා වැඩි කරන ලදී. එබැවින්, කෘෂිකාර්මික ක්ෂේත්‍රය සඳහා අවශ්‍ය කෘෂි රසායනික ද්‍රව්‍ය ප්‍රමාණවත් පරිදි වෙළඳ පොළට ගලා ඒම සිදුවිය. කෙසේ වුවද, කෘෂි රසායනික ද්‍රව්‍යවල පැවති අධික මිල ගණන් ගොවීන්ට දරා ගැනීමට නොහැකි වීම ගැටළුවක් ලෙස තවදුරටත් නිරීක්ෂණය කරන ලදී.

- 2022/23 මහ කන්නයේ වී සහ බඩඉරිඟු වගාව සඳහා අවශ්‍ය මුළු ඉන්ධන අවශ්‍යතාවය ලීටර් මිලියන 123 ක් විය. ඉන්ධන සැපයීමේ ගැටළුවක් පැවතිය ද, ගොවිතැන් කටයුතු සිදු කරනු ලබන ප්‍රදේශවල ප්‍රමාණවත් පරිදි ඉන්ධන සැපයීමට අවශ්‍ය ක්‍රියාමාර්ග යොදනු ලැබීය. ඊට අතිරේකව, ගොවීන් සහ ධීවරයින් සඳහා භූමිතෙල් සැපයුම වැඩි කිරීමට ද පියවර ගන්නා ලදී.

- ආහාර ස්ථායීතාවය පවත්වාගැනීම සඳහා 2022 ඔක්තෝබර් මස සිට ජනාධිපති කාර්යාලයට අනුබද්ධව "ආහාර ප්‍රතිපත්ති කමිටුවක්" ද පිහිටුවීමට පියවර ගන්නා ලදී. එම කමිටුව, අදාළ සියළු අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ සහභාගීත්වයෙන් යුක්තව ස්ථාපිත කරන ලද්දේ ඉන් පෙර පැවති "ජීවන වියදම් පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනු කමිටුව" සහ "ආහාර සුරක්ෂිතතාව පිළිබඳ කමිටුව" ප්‍රතිස්ථාපනය කරමිනි. එමඟින්, අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමේ හා බෙදා හැරීමේ සමස්ත යාන්ත්‍රණය තුළ පවත්නා වෙළඳපොල ගැටළු අනවශ්‍ය මැදිහත්වීම් වලින් තොරව ක්‍රමානුකූලව විසඳීමට අනුපූරක ප්‍රතිපත්ති යාන්ත්‍රණයක් දියත් කරන ලදී.

- එමෙන්ම, මෙවැනි ආර්ථික අර්බුදයක දී ආහාර ඇතුළු අත්‍යාවශ්‍ය භාණ්ඩ, හිඟයකින් තොරව වෙළෙඳපොළට සැපයීම මෙන්ම, ජීවන වියදම ඉහළ යාම හැකි තරම් පාලනය කිරීමට අවශ්‍ය පියවර ගැනීම සඳහා, දත්ත මත පදනම් වූ සාමූහික තීරණ ගැනීම මෙම කමිටුව තුළින් අපේක්ෂා කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස 2022 සැප්තැම්බර් මස 22 දිනට ජාතික පාරිභෝගික මිල දර්ශකය අනුව, ආහාර හා මද්‍යසාර නොවන පාන කාණ්ඩයේ වාර්තා වූ 85.8%ක වාර්තාගත උද්ධමන මට්ටම 2022 දෙසැම්බර් මස 31 වන විට 59.3% ක් දක්වා පහතට ගෙන ඒමට හැකි විය.

බලශක්ති සුරක්ෂිතතාවය

- බලශක්ති සැපයුම ස්ථාවර කිරීම සඳහා රජය විසින් රටේ අපනයන ආදායම සහ විදේශ ප්‍රේෂණයන්ට සරිලන පරිදි ප්‍රමුඛතාවය මත ඉන්ධන ගෙන්වා ගැනීමේ ක්‍රමවේදයක් ආරම්භ කිරීමටත්, කෝටා ක්‍රමයක් යටතේ ඉන්ධන නිකුත් කිරීමටත් පියවර ගන්නා ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස 2022 වසර අවසානයට පෙර ඉන්ධන පෝලිම් හා ගෑස් හිඟය මුළුමනින්ම තුරන් කිරීමට හැකියාව ලැබුණි.

- එමෙන්ම, 2023 වර්ෂය අවසානය දක්වාම ස්ථාවර ලෙස ගෑස් සැපයුම පවත්වා ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත හැකි විය. විදුලිබල උත්පාදනය සඳහා අවශ්‍ය ගල්අඟුරු සැපයුමද ස්ථාවර කර ගැනීමට හැකියාව ලැබුණි.

- **අඛණ්ඩ විදුලි සැපයුම** - ජාතික බලශක්ති ප්‍රතිපත්තිය අනුව වර්ෂ 2030 වනවිට රටේ විදුලි අවශ්‍යතාවයෙන් 70% ක් පුනර්ජනනීය විදුලි ප්‍රභව මඟින් ලබාගැනීමේ ඉලක්ක සපුරා ගැනීම සඳහා සාර්ථකව පියවර තැබූ වසරක් ලෙස 2022 වසර හැඳින්විය හැකිය. ඉන්දීය රජයේ ආයෝජන වැඩසටහන යටතේ ක්‍රියාත්මක වන ත්‍රිකුණාමලය තෙල් ගබඩා ව්‍යාපෘතිය, සාම්පූර් 50MW සූර්ය බලාගාරය, ඉන්දියා ශ්‍රී ලංකා ග්‍රිඩ් සම්බන්ධතාව ඇති කිරීමේ ව්‍යාපෘතිය සහ යාපනය අර්ධද්වීපයේ දූපත් 03 ක ජනතාව වෙත විදුලිය ලබාදීම සඳහා පුනර්ජනනීය දෙමුහුන් විදුලි බලාගාර ව්‍යාපෘතිය ආරම්භ කිරීම ආදිය ජනාධිපති කාර්යාලය මට්ටමින් සම්බන්ධීකරණය කළ එවැනි ව්‍යාපෘති අතර වේ.

- එමෙන්ම, සපුගස්කන්ද පිරිපහදුව පුළුල් හා නවීකරණය කිරීම සඳහා ශ්‍රී ලංකාව හා ඇමරිකා එක්සත් ජනපදය අතර ද්වීපාර්ශ්වික ආර්ථික සහයෝගිතාවක් ඇති කිරීමට හැකි විය.

- 2022 දී පහත සඳහන් කටයුතු අවසන් කිරීමට හැකියාව ලැබුණි.
  - පාලනයක් සහිතව ඉන්ධන මිලදී ගැනීමට හැකියාව ලැබෙන පරිදි විද්‍යුත් සලාක ක්‍රමයක් ඇති කිරීම සඳහා අවශ්‍ය ආයතන සම්බන්ධීකරණය කිරීම.
  - විදුලිය මිලදී ගැනීමේ ගාස්තු හා පරිභෝජන ගාස්තු සමාලෝචනය කර, වර්තමාන වෙළඳපොල තත්ත්වයන් සමඟ අනුගත වන පරිදි මිළ ක්‍රමයක් සකස් කිරීම සඳහා අවශ්‍ය කටයුතු කිරීමත් සහ ඒ සඳහා විදුලිබල මණ්ඩල පනත කඩිනමින් සංශෝධනය කිරීමට පියවර ගැනීම.
  - පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති මඟින් නිෂ්පාදන කරනු ලබන විදුලිය, ජාතික පද්ධතියට(National Grid) එක් කිරීමේදී සිදුවන ප්‍රමාදයන් සඳහා විසඳුම් ලබා දීම.
  - අපනයනය අරමුණු කරගත් කර්මාන්තකරුවන් වෙත ඉන්ධන ලබාදීමේදී ඩොලර් මඟින් ගෙවීම් කටයුතු සිදුකිරීම සඳහා අවස්ථාව ලබා දීම.
  - ශ්‍රී ලංකාව තුළ ඉන්ධන බෙදාහැරීම හා විකිණීම සඳහා වෙනත් පාර්ශ්ව/ ආයෝජකයන් සඳහා අවස්ථාව ලබාදීමට කටයුතු කිරීමත් ගෑස් සඳහා වන ලෝක බැංකු ආධාර යටතේ, ලිට්ට්‍රෝ ගෑස් ලංකා සමාගම සඳහා අවශ්‍ය ගෑස් ලබා ගැනීමට අදාළ ගිවිසුම් කටයුතු සිදු කිරීම.
  - 2023 වර්ෂයේ මාර්තු මස සිට විදුලි කප්පාදුව මුළුමනින්ම අවසන් කළ හැකි වන පරිදි, විදුලි කප්පාදුව දිනකට විනාඩි 140ක අවම මට්ටමකට ගෙන ඒමට එමගින් හැකියාව ලැබුණි.

පාරිසරික ආරක්ෂාව පිළිබඳ මානයන්

- ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා විසින් 2022 සැප්තැම්බර් 19 දින සිට 22 දින දක්වා එක්සත් රාජධානියේ සිදුකළ චාරිකාවේ දී ශ්‍රී ලංකාවේ ජාතික දේශගුණික විපර්යාස ප්‍රතිපත්ති සම්බන්ධයෙන් තම සැලසුම ඉදිරිපත් කරන ලදී. ශ්‍රී ලංකාවේ දේශගුණික විපර්යාස පිළිබඳ විශ්වවිද්‍යාලයක් පිහිටුවීමේ යෝජනාව සම්බන්ධයෙන් එහිදී කරුණු ඉදිරිපත් කරන ලදී. දේශගුණික විපර්යාසවලට එරෙහිව සටන් කිරීම සඳහා ශ්‍රී ලංකාව දරන ප්‍රයත්නය සඳහා පොදුරාජ්‍ය මණ්ඩලයේ සහාය ඉදිරියටත් ලබා දෙන බවට මහලේකම්වරිය විසින් ප්‍රතිඥා දෙන ලදී.

- එක්සත් ජාතීන්ගේ ආහාර සහ කෘෂිකර්ම සංවිධානය සමඟ 2022 සැප්තැම්බර් මස 25 වෙනි දින ශ්‍රී ලංකාවේදී පැවති සාකච්ඡාවේදී, රටේ පවතින ආහාර සහ ආර්ථික අර්බුදයට මුහුණ දීම සඳහා රජය විසින් ගනුලබන ක්‍රියාමාර්ග පිළිබඳ ව දැනුවත් කරමින් ඊට මුහුණ දීම සඳහා එම සංවිධානය විසින් ලබාදෙන සහයෝගය අගයන ලදී.

- 2022 සැප්තැම්බර් 28 සිට 30 දින දක්වා පිලිපීනයේ පැවති ආසියානු සංවර්ධන බැංකුවේ (ADB) 55 වැනි වාර්ෂික සමුළුවට සහභාගී වෙමින් පිලිපීනය සමඟ ද්විපාර්ශ්වික සබඳතා ශක්තිමත් කර ගැනීමේ වැදගත්කම ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා විසින් අවධාරණය කළ අතර, දේශගුණික විපර්යාස විශ්වවිද්‍යාලයක් ශ්‍රී ලංකාවේ පිහිටුවීම සඳහා, ආසියානු සංවර්ධන බැංකුවේ සහාය ශ්‍රී ලංකාව වෙත ලබා දෙන ලෙසටද යෝජනා කරන ලදී.

ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් හා මත්ද්‍රව්‍ය මැඩලීම

ත්‍රස්තවාදයෙන් හා මත් උවදුරින් බැට නොකන, බියෙන් සැකෙන් තොර සමාජයක් ස්ථාපනය කිරීම වෙනුවෙන් නව පනත් කෙටුම්පත් දෙකක් 2023 වසර තුළ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය මූලික කටයුතු අධිකරණ හා ආරක්ෂක විෂය බාර අමාත්‍යාංශ යටතේ සිදුකිරීමට යොමුකර ඇත. ඒවා නම්, ත්‍රස්තවාදය වැලැක්වීමේ සහ ජාතික ආරක්ෂක පනත සහ මත්ද්‍රව්‍ය මැඩලීමේ අණදෙන මූලස්ථාන පනත වේ. එමෙන්ම 2023 වසර තුළ වත්මන් සංදර්භයට අනුකූලව රාජ්‍ය ආරක්ෂාව සහතික කිරීමට සමත් ජාතික ආරක්ෂක ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීම සඳහා අවශ්‍ය මූලික ක්‍රියාමාර්ග දැනටමත් ගෙන ඇත.

3) පුරවැසියන් වෙත ඵලදායී ලෙස ප්‍රවේශ වීම

සෑම පුරවැසියකුටම නිශ්චිත ආර්ථික ස්ථාවරත්වයක්, දියුණුවීමේ සමාන අවස්ථා සහ ගෞරවාන්විත ජීවිතයක් ලබා දීමේ අයිතිය ස්ථාවර කරන ජනතා කේන්ද්‍රීය ආර්ථිකයක් ගොඩ නැගීම සඳහා වත්මන් ජනාධිපතිතුමා විසින් නිශ්චිත වැඩ සැලැස්මක් ක්‍රියාත්මක කරන ලදී.

කර්මාන්ත හා අපනයන අංශයන්ට එල්ල වී ඇති බාධාවන් ඉවත් කිරීමත්, ආර්ථිකය ස්ථාවර කිරීමේ වෑයමේ දී දිළිඳු හා අඩු වරප්‍රසාදිත කණ්ඩායම් රැකබලා ගැනීම සඳහා දැඩි අවධානයක් යොමු කිරීමත්, රටේ ව්‍යවසායකයන්ට ඔවුන්ගේ කුසලතා ඔස්සේ ඉදිරියට පැමිණීමේ මාර්ග තවත් පුළුල් කිරීමත්, පුළුල් මධ්‍යම පන්තියක් බිහිකිරීමට අවශ්‍ය පදනම සකස් කිරීමත් කෙරෙහි අවධානය යොමුකරන ලදී.

සමාජ ආරක්ෂණය

දුෂ්කර ආර්ථික තත්ත්වයෙන් පීඩාවට පත් ජනතාවට ලබාදෙන සමෘද්ධි, වැඩිහිටි , ආබාධ සහිත පුද්ගල/ වකුගඩු රෝගී / විපතට පත් පවුල් යනාදී සහන සැලසීම් සියල්ල කාර්යක්ෂම ලෙස ප්‍රේෂණය කිරීම සඳහා බැංකු ගිණුමක් හා සෘජු ලෙස ප්‍රේෂණ ක්‍රමයක් සකස් කිරීම, වැඩිහිටියන්, ආබාධ සහිත පුද්ගලයින් මෙන්ම නීති ආදායම් වැන්දඹුවන් ගෘහ ව්‍යවසායකයන් ලෙස ශක්තිමත් කිරීම, දිළිඳු හා අඩු වරප්‍රසාදිත කණ්ඩායම් රැක බලා ගනිමින් සහ ව්‍යවසායකයන් දිරිමත් කරමින් නිර්මාණය කරන්නා වූ සමාජ වෙළඳපොළ ආර්ථික ක්‍රමයකට අවශ්‍ය පදනම සකස් කිරීම වැනි ක්‍රියාමාර්ග රැසක් අදාළ අමාත්‍යාංශය හරහා ක්‍රියාත්මක කිරීමට යොමුකර ඇත.

සියළු ජන කොටස්වල දායකත්වය තහවුරු කිරීම

- ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය වෙනස්කම් මගින් හා දරුවන් සම්බන්ධයෙන් ඇතිවන ගැටළුකාරී තත්ත්වයන් පිටුදැකීම සඳහා කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභා පනත, ස්ත්‍රී-පුරුෂ සමානාත්මතා පනත, ස්ත්‍රී සවිබල ගැන්වීමේ පනත සහ ළමා අයිතිවාසිකම් පිළිබඳ පනත ඉදිරිපත් කිරීමටත්, කාන්තා සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳ ආයතනය ස්ථාපිත කිරීමටත් පියවර ගනිමින් පවතී.

- උතුරු හා නැගෙනහිර පළාත් වල පැවති අර්බුදකාරී තත්වය හේතුවෙන් එම ප්‍රදේශවල ඇති වූ පසුබෑම්, සහ 21 වන සියවසට අවශ්‍ය සමාජ හා ආර්ථික වෙනස්කම් සලකා බලමින් උතුරේ හා නැගෙනහිර පළාත්වල සංවර්ධන කටයුතු පිළිබඳව අලුතෙන් සැලසුම් සකස් කිරීම සඳහා මූලික පියවර ගෙන ඇත. විශේෂයෙන්ම, ගරු ජනාධිපතිතුමාගේ මෙහෙයවීම යටතේ පත්කළ කමිටුවක් විසින් **"සත්‍ය හා ප්‍රතිසංධාන යාන්ත්‍රණය"** සංකල්පයක් ලෙස පිළිගැනීම, එය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය හා නීතිය හඳුන්වාදීම සහ අවශ්‍ය ප්‍රතිපාදන සැලසීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශය 2022 වසර අවසානයට පෙර සකස් කර තිබුණි. ඒ අනුව 2023 වර්ෂය තුළ සත්‍ය හා ප්‍රතිසංධාන කොමිෂන් සභාව නෛතිකව ස්ථාපනය කිරීම හා යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීම ඉලක්ක කරමින් දියත් කෙරෙන ක්‍රියාමාර්ග සාර්ථකව ආරම්භ කර ඇත.

- රාජ්‍ය පාලනය සඳහා සියළු ජන කොටස් සහභාගී කරගැනීම පිණිස සිදු කළ යුතු සමාජ හා දේශපාලන ප්‍රතිසංස්කරණ කවරේදැයි තීරණය කිරීම සඳහා ජනසභා ක්‍රමය හඳුන්වා දීමට පියවර ගන්නා ලද අතර, එම සංකල්පය දියත් කිරීමට අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා අනුමැතිය ලැබීම මත, ජනසභා ලේකම් කාර්යාලය 2022 වසර තුළදීම ආරම්භ කරන ලදී.

- එමෙන්ම, ජාතික ආරක්ෂාව තහවුරු කිරීමට අවශ්‍ය නිසි ක්‍රියාමාර්ග පුළුල් සහභාගීත්වයක් සහිතව ගැනීම පිණිස දේශපාලනමය මැදිහත්වීම් රැසක් ද දැනටමත් සිදුකර ඇත. විශේෂයෙන්ම පාර්ලිමේන්තුව නියෝජනය කරන සියළු දේශපාලන පක්ෂ නායකයන්ගෙන් සමන්විත ජාතික සභාවක් පිහිටුවීමට පියවර ගත් අතර, එම ජාතික සභාව අනු කමිටු දෙකක් වශයෙන් ක්‍රියාත්මක වෙමින් තීරණ ගැනීමේ ක්‍රියාවලිය තුළ පුළුල් සහභාගීත්වය සහතික කිරීම සඳහා අවශ්‍ය දායකත්වය ලබා දෙමින් පවතී.

- එමෙන්ම සර්වපාක්ෂික සමුළුවක් කැඳවමින්, පාර්ලිමේන්තුව නියෝජනය කරන සියළු පක්ෂවල අදහස් හා සහයෝගය තීරණ ගැනීමේ ක්‍රියාවලිය සඳහා යොදාගැනීමට පියවර ගන්නා ලදී. විශේෂයෙන්ම, ආගමික නායකයන්, සියලු ජාතීන්, තරුණ ප්‍රජාව, සියලු පක්ෂ හා කණ්ඩායම්, වෘත්තිකයන්, විදේශගත ශ්‍රී ලාංකික දමිළ ප්‍රජාව ඇතුළු සියලුම පාර්ශවකරුවන්ගේ සහයෝගය ජාතික ආරක්ෂාව හා සංවර්ධනය සඳහා නිර්මාණශීලී ලෙස යොදාගැනීම පිළිබඳව 2022 වසර තුළ සාර්ථක අන්දමින් අවධානය යොමුකරන ලදී. විශේෂයෙන්ම විදේශගත ශ්‍රී ලාංකිකයින්ගේ සහයෝගය හා සහභාගීත්වය රටේ සංවර්ධන ක්‍රියාවලියට ඇතුළත් කරගැනීම සඳහා විදේශගත ශ්‍රී ලාංකයින්ගේ කටයුතු සඳහා වූ කාර්යාලය (OOSLA) ජනාධිපති කාර්යාලයට අනුබද්ධව ස්ථාපනය කරන ලදී.

4) ආයතනික ප්‍රතිව්‍යුහගතකරණය

ආර්ථික ස්ථායීකරණ ක්‍රියාවලිය තුළ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් ආර්ථිකයේ සියලුම අංශ හරහා පුළුල් ප්‍රතිසංස්කරණ සිදුකිරීමට පියවර ආරම්භ කරන ලදී.

- ඒ අනුව, 2022.09.05 දින අමාත්‍ය මණ්ඩල තීරණයක් මගින් රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය සඳහා ආයතනය (NAPPP) සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිව්‍යුහගත කිරීමේ ඒකකය ස්ථාපිත කිරීමට පියවර ගන්නා ලදී. රාජ්‍ය ආයතන රැසක් ප්‍රතිව්‍යුහගත කිරීම හරහා ඉහළ තරගකාරී කාර්යසාධනයක් ජනිත කිරීමටත්, පාඩු ලබන රාජ්‍ය ව්‍යවසායයන් සඳහා තිරසාර ආදායම් ක්‍රම හඳුන්වා දීමටත් එම ඒකක හරහා මූලික ක්‍රියාමාර්ග ගෙන ඇත. එමෙන්ම, ජාතික ණය කළමනාකරණ නියෝජිතායතනය පිහිටුවීමට අවශ්‍ය තාක්ෂණික සහාය ලබා ගැනීම සඳහා අන්තර්ජාතික විශේෂඥ ආයතන සමඟ මූලික සාකච්ඡා පවත්වන ලදී. 2023 වසර තුළ මෙම නව ආයතන පද්ධතිය හරහා ආර්ථිකය තුළ කැපී පෙනෙන වෙනස්කම් සිදුවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

- පූර්ණ ස්වාධීනත්වයක් ඇති පාර්ලිමේන්තු අයවැය කාර්යාලයක් ස්ථාපිත කිරීම සඳහා අදාළ පනත් කෙටුම්පත සකස් කිරීමට 2022.12.05 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. ඒ අනුව 2023 වර්ෂය තුළ එකී පාර්ලිමේන්තු අයවැය කාර්යාලය නෛතික පදනමක් මත ස්ථාපිත කිරීමේ කාර්යය සම්පූර්ණ කිරීමට නියමිතය.

- ජාත්‍යන්තර වෙළඳාම වර්ධනය කරගැනීම සඳහා සියලුම ජාත්‍යන්තර වෙළඳ සාකච්ඡා සම්බන්ධයෙන් කටයුතු කරන **ජාත්‍යන්තර වෙළඳ කාර්යාලයක්** 2023 ජූලි මාසය වන විට නෛතික පිළිගැනීමක් සහිතව ස්ථාපනය කිරීමේ මාර්ග සැලැස්මක් සහිතව කටයුතු කිරීම 2022 අවසාන කාර්තුව තුළ ආරම්භ කරන ලදී. එමගින් ගෝලීය වෙළඳපල තුළ තරග කිරීමට ශ්‍රී ලංකාවට ඇති හැකියාව ඉහළ යාම සහ ගෝලීය වෙළඳපල ප්‍රවේශය වැඩිදියුණු වීම අපේක්ෂා කෙරේ.

2.2 ඉදිරි දැක්ම

ශ්‍රී ලංකාව 2048 නිදහසේ ශත සංවත්සරයට ළඟා වන විට දියුණු ආර්ථිකයක් ඇති රටක් බවට පත්වීම රජයේ ඉලක්කය ලෙස ප්‍රකාශ කර ඇත. ඊට අනුගතව ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙල මඟින් ඉලක්ක කරනුයේ වත්මන් පරම්පරාව පමණක් නොව ඉදිරි පරම්පරා ගණනාවකගේ අභිවෘද්ධිය වන බැවින් එම වැඩපිළිවෙල, ශ්‍රී ලංකා ආර්ථිකය ඉතා තරඟකාරී, විවෘත සහ සමාජ සාධාරණත්වය මත පදනම්ව සිදු කරන සංවර්ධනයකට මඟපෙන්වන්නක් විය යුතු බව රජය විසින් අවධාරණය කර ඇත.

සැලසුම් කර ඇති දීර්ඝ කාලීන ආර්ථික සංධිස්ථාන



මෙම සංදර්භය තුළ ක්‍රියාත්මක වීමේදී 2022 සිට ගන්නා ලද මූලාරම්භයන් ඉදිරියට පෙළගස්වමින් 2023 වසරේ සිට එළැඹෙන මධ්‍ය කාලීන රාමුව තුළ ක්‍රියාත්මක වන ක්‍රමෝපායික මාර්ග සිතියමෙහි ප්‍රධාන අංගයන් පහත පරිදි දැක්විය හැකිය.

1) සාර්ව ආර්ථික ස්ථාවරත්වය තහවුරු කිරීම
2) වඩා හොඳ ආර්ථික පාලනයක් සහ ආර්ථිකමය තීරණ ගැනීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැකසීම
3) ශ්‍රී ලංකා ආර්ථිකයේ තරඟකාරීත්වය වැඩි දියුණු කිරීම
4) සියලු ජන කණ්ඩායම්වල සමාජමය අන්තර්ගතභාවය සහතික කිරීම

1) සාර්ව ආර්ථික ස්ථාවරත්වය තහවුරු කිරීම

2025 වසර වන විට ප්‍රාථමික අයවැයෙහි අතිරික්තයක් ඇති කර ගැනීමත්, ඒ මත 2026 වසර වන විට ස්ථාවර ආර්ථික පදනමක් ඇති කර ගැනීමත්, වසර 2032 වන විට රාජ්‍ය ණය ප්‍රමාණය දළ දේශීය නිෂ්පාදිතයෙන් 100% මට්ටමට වඩා අඩු මට්ටමකට ගෙන ඒමත්, ඉලක්ක කර ඇත. ඊට අදාළව සිදුකළ යුතු ආර්ථික, මූල්‍ය හා ආයතනික අංශයන්හි සියලු ප්‍රතිසංස්කරණ, සැලසුමකට අනුව ප්‍රමුඛතාගත කර ක්‍රියාත්මක කරමින් පවතී. රට මුහුණ දී ඇති මූල්‍ය අර්බුදයට ස්ථාවර පිළියම් යෙදීම සඳහා අභ්‍යන්තර වශයෙන් මුදල් හා මූල්‍ය ප්‍රතිපත්ති රැසක් සමාලෝචනයට බඳුන් කර ඇති අතර, ඒවා වෙනස්වන අවශ්‍යතාවයන් හා දේශීය ආර්ථිකයේ අවශ්‍යතාවයන් මත පදනම් වෙමින් නම්‍යශීලී ලෙස තවදුරටත් සමාලෝචනය කරමින් පවතී.

සාර්ව ආර්ථික රාමුවෙහි සිදු කිරීමට බලාපොරොත්තු වන වෙනස්කම් කිහිපයක් පහත දැක්වේ;

- විස්තීරණ ණය පහසුකම (EFF) සාර්ථකව ක්‍රියාත්මක කිරීම ආයෝජකයින්ගේ විශ්වාසය ඉහළ නැංවීමට සහ විදේශ විනිමය ගලා ඒම තවදුරටත් ආකර්ෂණය කර ගැනීමට උපකාරී වන අතර දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ සම්බන්ධයෙන් ගනු ලබන ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග විදේශ විනිමය ද්‍රවශීලතාව සහ නිල සංචිත ඉහළ නංවනු ඇත.

- ආදායම් මත පදනම් වූ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍ර කිරීම (Revenue Based Fiscal Consolidation) පිණිස විධිමත් ආදායම් කළමනාකරණ යාන්ත්‍රණයක් පිහිටුවීම සඳහා ආදායම් අධිකාරී පනතක් සකස් කිරීමට අපේක්ෂා කෙරේ. එය බදු පිළිබඳ ජනාධිපති කොමිෂන් සභාව පිහිටුවීමෙන් පසු එම සභාවේ නිර්දේශ මත පදනම්ව සිදු කෙරෙනු ඇත.

- බදු ව්‍යුහය සංශෝධනය කිරීම/ බදු විෂමතා නිවැරදි කිරීම සඳහා 2022.12.31 දින අයවැය මඟින් සංශෝධිත බදු නීති සහ IMF වැඩසටහන යටතේ 2023.01.01 සිට ක්‍රියාත්මක වේ. මේ අනුව අදාළ ආදායම් ඉලක්ක සපුරා ගනිමින් පවතී.

- 2025 වන විට ප්‍රාථමික අයවැය අතිරික්තයක් ලබා ගැනීම සඳහා බදු ව්‍යුහය, බදු පදනම සහ බදු ප්‍රතිශත වෙනස් කර නව බදු වර්ග හඳුන්වා දීමට පියවර ගෙන ඇති අතර බදු පැහැර හැරීම අවම කර බදු එකතු කිරීමේ කටයුතු කාර්යක්ෂම කිරීමටත් පියවර ගනිමින් සිටින අතර රාජ්‍ය වියදම් තිරසාර ලෙස පවත්වාගෙන යාම සඳහා පුනරාවර්තන වියදම් අඩු කිරීමටත් අත්‍යවශ්‍ය නොවන සංවර්ධන වියදම් සීමා කිරීමටත් පියවර ගැනේ.

- බැංකු අංශයේ ප්‍රතිසංස්කරණ හා රාජ්‍ය අංශයේ වැටුප් පිරිවැයෙහි වර්ධනය සීමා කිරීම වැනි මූල්‍ය ස්ථාවරත්වය කෙරෙහි පිටුවහලක් වන ප්‍රතිපත්ති සහ ප්‍රතිසංස්කරණ තව දුරටත් සිදු කරනු ඇත.

2) වඩා හොඳ ආර්ථික පාලනයක් සහ ආර්ථිකමය තීරණ ගැනීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැකසීම

- **ආර්ථිකමය ප්‍රත්‍යස්ථිතිය / ඔරොත්තු දීමේ හැකියාව සහතික කරනු පිණිස;**

i. ඉදිරි වසර 25 සඳහා ජාතික ආර්ථික ප්‍රතිපත්තියක් අනුව සකස් කරන ලද නිශ්චිත මාර්ග සිතියමකට අනුව කටයුතු කිරීමටත් එහි නිවැරදි රාජ්‍ය මූල්‍ය මෙහෙයුම් ක්‍රියාකාරිත්වය සහතික කරනු පිණිස පූර්ණ ස්වාධීනත්වය සහිත පාර්ලිමේන්තු අයවැය කාර්යාලයක් පිහිටුවීමටත් අපේක්ෂා කෙරේ. අයවැය කාර්යාලය පිහිටුවීමට අදාළ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය හිමිව තිබේ.

ii. විචක්ෂණ වියදම් කළමනාකරණයක් සඳහා ශූන්‍ය පාදක අයවැය (Zero Based Budget ing) ක්‍රමයක් මීළඟ අයවැය සකස් කිරීමේදී සිදු කිරීම. මේ සඳහා වැඩිම අයවැය ප්‍රතිපාදන ලැබෙන අමාත්‍යාංශ 10 සඳහා වියදම් සමාලෝචන කමිටු පත් කර ඇති අතර කමිටුව විසින් නිර්දේශිත පියවර 2023 අප්‍රේල් මාසයේදී ඉදිරිපත් කරනු ඇත.

iii. මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීම සම්බන්ධයෙන් වැඩි ස්වාධීනත්වයක් ලබා දීම සහ වඩාත් ස්වාධීන ආයතනයක් ලෙස ක්‍රියා කිරීමට මහා බැංකුවට ඉඩ සැලසීම පිණිස නව මහ බැංකු පනත බලාත්මක කිරීමට පියවර ගනු ඇත.

iv. දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතීන් සමඟ එකඟ වීම සඳහා නව දූෂණ විරෝධී නීති සම්පාදනය කිරීම.

v. සේවා සැපයුමෙහි මූල්‍යමය තිරසාර බව තහවුරු කිරීම පිණිස ප්‍රතිසාධන මිල ක්‍රියාත්මක කිරීම—ඉන්ධන මිල සූත්‍රය, අවසාන පරිශීලක විදුලි ගාස්තු ගැලපීම, විදුලි සහනාධාරය නිවැරදිව මැනීමට තොග සැපයුම් ගණුදෙණු ගිණුම (BSTA) වැඩිදියුණු කිරීම වැනි ක්‍රියාමාර්ග ගැනීම.

vi. රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ; 2017 සිට 2022 දක්වා වසර 5 ක කාලය තුළ උපායමාර්ගික ලෙස හඳුනාගෙන ඇති රාජ්‍ය ව්‍යවසාය 52 ක් රුපියල් බිලියන 443 ක පාඩුවක් ලබා ඇත. මින් තෝරාගත් රජය සතු ව්‍යවසාය සඳහා ප්‍රතිසංස්කරණ ගෙන ඒම අරමුණු කර ගනිමින් මහජනතාවට සාධාරණ මිලට ගුණාත්මක භාණ්ඩ හා සේවා ලබා දීම, වැඩි ආයෝජනයක් ආකර්ෂණය කර ගන්නා වඩාත් තරගකාරී ව්‍යාපාරික පරිසරයක් නිර්මාණය කිරීම සහ එම ව්‍යවසාය මඟින් රජයට සිදුවන මූල්‍යමය බර අවම කිරීම සඳහා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ අංශය ස්ථාපනය කරන ලද අතර ඉදිරියේදී එම ව්‍යවසායන් ප්‍රතිව්‍යුහගත කිරීමේ දී පහසුකම් සැලසීමට සහ රජය වෙනුවෙන් එම කොටස් පවත්වා ගැනීමට එසේ තෝරාගත් ව්‍යවසායයන් පරිපාලක සමාගමකට (Holding Company) පැවරෙනු ඇත.

vii. කොළඹ වරාය නගරයෙහි සංවර්ධනය දළ දේශීය නිෂ්පාදිතයට මෙන්ම සෘජු විදේශ ආයෝජන ගලා ඒමටත් නව රැකියා උත්පාදනයත් සඳහා සැලකිය යුතු ලෙස බලපානු ඇත. මෙහි මූලික යටිතල පහසුකම් 2023 වසර අවසානයේ නිම කිරීමට නියමිතය. වරාය නගරයේ තීරුබදු රහිත සංකීර්ණය (එ.ජ.ඩොලර් මිලියන 15) 2023 ජූනි වන විට විවෘත කිරීමට නියමිත අතර 2023 තුන්වන කාර්තුවේදී කොළඹ අන්තර්ජාතික මූල්‍ය මධ්‍යස්ථානයෙහි (CIFC) පළමු අදියර - කුළුණු 3, විලා බිම් කොටස සහ මරීනා හෝටලය ඉදිකිරීම් ආරම්භ කිරීමටත් අපේක්ෂිතය. 2023 ප්‍රක්ෂේපිත මුදල් ගලා ඒම එ.ජ.ඩොලර් මිලියන 3.11කි.

- **මධ්‍ය කාලීන යටිතල පහසුකම් සංවර්ධන ක්‍රමෝපාය**

i. බස්නාහිර පළාත, වයඹ පළාත, හම්බන්තොට සහ මඩකලපුව යන ස්ථානවල නව ආර්ථික කලාප පිහිටුවීම - වගවත්ත, බිංගිරිය, හම්බන්තොට-අරබොක්ක, සහ එරාවුර්.

ii. බලශක්ති අංශයේ ප්‍රතිසංස්කරණ - විදුලි ඉල්ලුම වර්ධනය වාර්ෂිකව 5% කි. වර්ධනය වන ඉල්ලුමට සරිලන පරිදි ප්‍රමාණවත් ජනන ධාරිතාවක් වර්ධනය කිරීම තිරසර ජනනයට බාධාවකින් තොරව පුද්ගලික ආයෝජන හරහා සිදු කෙරෙනු ඇත. අමාත්‍ය මණ්ඩලය විසින් විශේෂඥ කමිටුවක් පත් කර ඇති අතර එමඟින් නීතිමය සහ ආයතනික ප්‍රතිසංස්කරණ අධ්‍යයනය කර නිර්දේශ කරනු ඇත.

iii. ශ්‍රී ලංකාවේ බලශක්ති අවශ්‍යතාවය සුනිත්‍ය බලශක්ති ප්‍රභව වෙත යොමුකිරීමේ වැයමක් ලෙස ග්‍රීන් හයිඩ්‍රජන් යොදාගැනීමේ මාර්ග සිතියමක් සම්පාදනය කිරීම දැනටමත් ආරම්භ කර ඇත. ඒ අනුව, 2023 අප්‍රේල් මාසය වන විට ජාතික හයිඩ්‍රජන් මාර්ග සිතියම සකස් කිරීම අවසන් කිරීමටත්, 2023 අගෝස්තු මාසය වන විට ශක්‍යතා අධ්‍යයනය අවසන් කිරීමටත්, 2024 හා 2026 කාලසීමාව තුළ නියමු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමටත්, 2026 වර්ෂයේ සිට ග්‍රීන් හයිඩ්‍රජන් වාණිජමය වශයෙන් යොදාගැනීමටත් නියමිතය.

iv. බලශක්ති ක්ෂේත්‍රයට තරඟකාරිත්වය ගෙන ඒම හරහා බලශක්ති සුරක්ෂිතතාව සහතික කිරීම; සියලුම ව්‍යාපාරික අංශ ආවරණය වන පරිදි ක්ෂේත්‍රයේ තරඟකාරිත්වය ඉහළ නැංවීම සඳහා 2022 අංක 27 දරන ඛනිජ තෙල් නිෂ්පාදන (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත සම්මත කරන ලදී. ඉන්ධන බෙදා හැරීම සම්බන්ධයෙන් තවත් සැපයුම්කරුවන් හඳුන්වා දීමට පියවර ගනු ඇත. රාජ්‍ය-පෞද්ගලික හවුල්කාර ව්‍යාපෘති (PPP) ආකෘතිය යටතේ පිරිපහදුව සහ අනෙකුත් යටිතල පහසුකම් සංවර්ධනය කිරීම අරමුණයි.

- **දේශීය දේශගුණික විපර්යාස අභියෝග සහ අපේක්ෂාවන් ආමන්ත්‍රණය කිරීමට එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාස පිළිබඳ රාමු සම්මුතියේ 27 වන සමුළුවෙහි (COP27) කැපවීම්**

i. අඩු කාබන් සංවර්ධන මාර්ගවලට හරිතාගාර වායු විමෝචනය කළමනාකරණය කිරීම සහ නියාමනය කිරීම, දේශගුණික විපර්යාසවල අහිතකර බලපෑම් වලට අනුවර්තනය වීම, දේශගුණික විපර්යාස සම්බන්ධ ක්‍රියාමාර්ග සම්බන්ධීකරණය කිරීම සහ අධීක්ෂණය කිරීම සහ දේශගුණික විපර්යාස ආශ්‍රිත මූල්‍ය, ව්‍යාපෘති සහ වැඩසටහන් අධීක්ෂණය සහ පහසුකම් සැලසීම පිණිස ජාතික දේශගුණික විපර්යාස පනත සංශෝධනය කිරීම.

ii. දේශගුණික විපර්යාස හා හරිත මූල්‍ය කටයුතු සඳහා ලේකම් කාර්යාලයක් ස්ථාපනය කිරීම; දේශගුණ විපර්යාස කාර්යාලය, ජාත්‍යන්තර දේශගුණික විපර්යාස විශ්ව විද්‍යාලය, හරිත මූල්‍ය පහසුකම් සැපයීම සහ සමුද්‍රීය අවකාශීය සැලසුම් ඇතුළු සහාය සේවා යන අංශ හතරක් ලේකම් කාර්යාලය විසින් ආවරණය කරනු ලබයි.

- **තාක්ෂණය සහ ඩිජිටල්කරණය ප්‍රවර්ධනය කිරීම**

ඩිජිටල් ආර්ථිකයක් ප්‍රවර්ධනය කිරීම සඳහා ඩිජිටල් ආර්ථික උපායමාර්ගය ඇතුළත් ඩිජිටල් තාක්ෂණ පනත 2023 වර්ෂය තුළ ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය මූලික ක්‍රියාමාර්ග 2022 සිව්වැනි කාර්තුව තුළ ගන්නා ලදී. ඒ අනුව 2023 වර්ෂය තුළ දත්ත ආරක්ෂණ අධිකාරියක් පිහිටුවීමත්, විද්‍යුත් ක්‍රමවේද මගින් ගෙවීම් ප්‍රවර්ධනය කිරීමත්, බදු පරිපාලනය සඳහා ඩිජිටල් වේදිකාවක් සකස් කිරීමට සහාය වීමත්, පසු අස්වනු නාස්තිය අවම කිරීම සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණය ව්‍යාප්ත කිරීමත් වෙනුවෙන් ජනාධිපති කාර්යාලය විසින් අදාළ අමාත්‍යාංශය සමග පියවර ගැනීමට නියමිතය.

කෘතිම බුද්ධිය (AI) සූදානම වැඩි කිරීම; 2023 දී විශේෂඥ කමිටුවක් විසින් වටිනාකම් දාමය හරහා කෘතිම බුද්ධිය (AI) සංවර්ධනය කිරීම සඳහා උපාය මාර්ගයක් සහ මාර්ග සිතියමක් සැකසීම. කමිටුවේ නිර්දේශ මත පදනම්ව, 2024 දී මාර්ග සිතියම ක්‍රියාත්මක කිරීම සඳහා රු. බිලියන 1 ක් ආයෝජනය කෙරේ.

ආරක්ෂිත විද්‍යුත් ගනුදෙනු සඳහා පහසුකම් සැලසීම සඳහා ජාතික සහතික කිරීමේ අධිකාරිය (National Certification Authority) පිහිටුවීම; NCA දැනටමත් ස්ථාපිත කර ඇත. CSP වෙත ඇතුල්වීම 2023 දෙසැම්බර් 31 වන විට අවසන් වේ.

- **ඉඩම් ප්‍රතිසංස්කරණ**

ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා උපකාරී වන හා පහසුව සැලසෙන ඉඩම් ප්‍රතිපත්තියක් නොමැති වීම හේතුවෙන් ඉඩම් හදුනා ගැනීමේ සහ අත්පත් කර ගැනීමේ හෝ බදු පදනමින් ලබා ගැනීමේ ගැටළු හා ප්‍රමාදයන් ඇතිවේ. එම ගැටළු ආමන්ත්‍රණය කිරීම පිණිස පහත සඳහන් ක්‍රියාමාර්ග දියත් කර ඇත.

i. රජයේ ඉඩම් බැහැර කිරීම - රජයේ සියලුම ඉඩම් බැහැර කිරීමට අදාළ මූලික කටයුතු ප්‍රාදේශීය ලේකම්වරුන්ට කිරීමට හැකිවන පරිදි වැඩපිළිවෙලක් සකස් කෙරේ. බැහැර කිරීමේ ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා විශේෂ ජනාධිපති කමිටුවක් පිහිටුවා කමිටු වාර්තාවක් ඉදිරිපත් කර ඇත.

ii. නව ඉඩම් අත්පත්කර ගැනීමේ පනත් කෙටුම්පතක් හඳුන්වාදීම - සංකල්පය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර පනත් කෙටුම්පත කෙටුම්පත් කරමින් පවතී.

- **කෘෂි ව්‍යාපාර බවට පරිවර්තනයක් සිදු කිරීම උදෙසා කෘෂිකාර්මික නවීකරණය -**

i. වසර 25 ක කාල රාමුවක් හා අදියර I - 2023-2028; අදියර II- 2029-2038; අදියර III - 2039-2048 වශයෙන් අදියර තුනකින් යුතු කෘෂිකාර්මික නවීකරණ උපායමාර්ගික රාමුවක් තේමාත්මක ක්ෂේත්‍ර 16ක් යටතේ සකස් කෙරේ. මාස තුනක කාලයක් තුළ ප්‍රතිපත්ති කෙටුම්පත් කිරීම සඳහා කමිටුවක් පත් කර ඇති අතර අවසන් වාර්තාව 2023 අගෝස්තු මාසය අවසන් වීමට පෙර ඉදිරිපත් කෙරේ. එම වැඩපිළිවෙල ඉහළ ප්‍රමුඛතාවයකින් ක්‍රියාත්මක කිරීම සහ වඩා හොඳ සම්බන්ධීකරණයක් සිදු කිරීම සඳහා කෘෂි නවීකරණ ලේකම් කාර්යාලයක් ජනාධිපති කාර්යාලයේ ස්ථාපනය කෙරෙනු ඇත.

ii. **අඩු ක්‍රියාකාරී වැවිලි සමාගම් සඳහා නව බදු දීම**—නව බදු දීම සඳහා පදනම සොයා ගැනීම සඳහා වැවිලි ප්‍රතිසංස්කරණ කමිටුව (PRC) සමාගම්වල ක්‍රියාකාරීත්වය තක්සේරු කිරීම සඳහා 2018 වසරේ පවත්වන ලද සමීක්ෂණය යාවත්කාලීන කරනු ඇත.

iii. **කිරි කර්මාන්තයේ වාණිජමය සංවර්ධනය**—ඉන්දියානු රජය සමඟ G2G සහයෝගිතා රාමුවක් යටතේ, තෝරාගත් NLDB ගොවිපලවල මෙහෙයුම් වැඩිකර වර්තමානයේ කිරි කර්මාන්තය තුළ පවතින ඌණතාවයන් සහ ආනයන මත යැපීම යන තත්වයේ සිට ස්වයංපෝෂිත භාවයට පරිවර්තනය කල හැකි අයුරින් වාණිජමය ව්‍යාපාරයක් ස්ථාපිත කිරීමට නියමිතය.

- **ශ්‍රී ලංකාව වසර පුරාම ක්‍රියාත්මක සංචාරක ගමනාන්තයක් බවට පත් කිරීම**

ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාරයේ ප්‍රධාන ඉලක්කය වන්නේ සංචාරක පැමිණීම් මිලියන 2 දක්වා වැඩි කිරීම සහ ඩොලර් බිලියන 5 කට වැඩි ආදායමක් උපයා ගැනීමයි. ඉන්දියාව, රුසියාව, එක්සත් රාජධානිය, ජර්මනිය, ප්‍රංශය සහ චීනය ඇතුළු ප්‍රධාන වෙළඳපොළ නවයක් කෙරෙහි අවධානය යොමු කරන අතරම ජපානය, කොරියාව, ජෝර්ජියාව, ඕස්ට්‍රේලියාව, නවසීලන්තය සහ නැගෙනහිර යුරෝපයේ රටවල් වැනි නව වෙළඳපොළ අත්පත් කර ගැනීමට අපේක්ෂා කෙරේ. එමෙන්ම දිගු සති අන්ත සංකල්පය මත පදනම්ව 2023 දී සියලුම පළාත්වල දේශීය සංචාරක ව්‍යාපාරය ඉහළ නැංවීම ඉලක්ක කර සිටී. මේ සඳහා සැලැස්මක් සකස් කර එය ක්‍රියාත්මක කිරීමට කමිටුවක් පත් කර ඇති අතර එම කමිටුවේ අවසන් වාර්තාව 2023 මැයි මාසය වන විට ඉදිරිපත් කරනු ඇත.

3) ශ්‍රී ලංකා ආර්ථිකයේ තරගකාරීත්වය වැඩි දියුණු කිරීම

තරගකාරී අක්වෙරළ ආර්ථිකයක් කරා;

ආර්ථිකය ප්‍රකෘතිමත් කිරීම සඳහා ගෙන ඇති දැඩි ක්‍රියාමාර්ග යටතේ, වර්ධන ප්‍රවර්ධක බලවේග විශාල වශයෙන් ශක්තිමත් කිරීමට රජය අපේක්ෂා කරයි.

1. හිතකර ආයෝජන පරිසරයක් නිර්මාණය කිරීම

ආයෝජකයින්ට හිතකර පරිසරයක් නිර්මාණය කිරීම සඳහා සාර්ව ආර්ථික මට්ටමේ මූලපිරීම් සහ ක්‍රියාමාර්ග සිදු කරන අතරතුර, අවම පිරිවැයක් තුළ - අවම කාලයකින් - සරල ක්‍රියාපටිපාටියක් සහිතව අවශ්‍ය සේවා සැපයීම සඳහා අදාළ ක්‍රියාවලීන් පහසු කිරීමට සහ ආයතන වඩාත් විනිවිදභාවයෙන් කටයුතු කිරීමට අදාළ ක්‍රියාවලීන් වැඩිදියුණු කිරීම තුළින් ව්‍යාපාර සක්‍රීය පරිසරයක් (Business Enabling Environment) නිර්මාණය කිරීමට රජය තවදුරටත් කැපවී සිටී.

ව්‍යාපාරයක් ආරම්භ කිරීම, ව්‍යාපාරයක් පවත්වාගෙන යාම සහ ව්‍යාපාරයක් පුළුල් කිරීම යන සෑම අදියරකදීම අදාළ වන අනිවාර්ය සේවා සම්බන්ධයෙන් කටයුතු කරන විවිධ ව්‍යාපාරික පහසුකම් සපයන රාජ්‍ය ආයතන 54 කින් සමන්විත පහත සඳහන් කාර්ය සාධක බලකා කමිටු අටකට ගොනු කර ප්‍රමුඛතා පදනමින් ආයතනික පද්ධති සංවර්ධන/ප්‍රතිසංස්කරණ සිදු කිරීම සඳහා අදාළ ක්‍රියාකාරී සැලසුම් සකස් කර ඇත.

i. ව්‍යාපාරයක් ආරම්භ කිරීම
ii. දේපළක් ලියාපදිංචි කිරීම
iii. ඉදිකිරීම් බලපත්‍ර කඩිනම් කිරීම
iv. දේශසීමාව හරහා වෙළඳාම් කිරීම
v. ව්‍යාපාර සඳහා ණය ලබා ගැනීම
vi. බංකොලොත්භාවයෙන් මිදීම
vii. සුළු ආයෝජකයින් ආරක්ෂා කිරීම
viii. ගිවිසුම් බලාත්මක කිරීම

මෙම කාර්ය සාධන බලකා කමිටු අට විසින් 2022-2024 කාලය තුළ දී ක්‍රියාකාරී සැලසුම් අදාළ ආයතන විසින් නිශ්චිත කාල රාමු තුළ ඉටු කිරීම පිළිබඳව ජනාධිපති කාර්යාලය විසින් සමීපව අධීක්ෂණය කරනු ලබයි.

මෙම කාර්ය සාධක බලකායන් විසින් 2023දී හෝ 2024 මුල් භාගය තුළ අවසන් කරන ප්‍රධාන කටයුතු පහත දැක්වේ;

<u>ඊ-ඉඩම් පද්ධති සංවර්ධනය</u> • කොළඹ ඉඩම් රෙජිස්ට්‍රාර් හි හිමිකම් සෙවුම් (Title Search) මාර්ගගත පද්ධතිය ස්ථාපිත කිරීම. • බස්නාහිර පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ ස්ථාපිත ස්වයංක්‍රීය මුද්දර ගාස්තු ගණනය කිරීමේ පද්ධතිය. • කොළඹ ඉඩම් රෙජිස්ට්‍රාර් හි ඔප්පු ලියාපදිංචි කිරීමේ ස්වයංක්‍රීය පද්ධතිය.	<u>ඊ-සමාගම් රෙජිස්ට්‍රාර් (e-RoC) මෙහෙයුම්වල සහ නියාමනයන්හි වැඩිදියුණු කිරීම</u> • භෞතික අත්සන ලබා ගැනීමට ගතවන කාලය අඩු කිරීම සහ සම්පූර්ණයෙන්ම කඩදාසි භාවිතය අඩු කිරීම සඳහා e-RoC පද්ධතියේ ඩිජිටල් අත්සන හඳුන්වා දීම. • මුල්‍යමය විනිවිදභාවය වැඩි දියුණු කිරීම සඳහා අවසාන ප්‍රතිලාභීන්ගේ අයිතිය සමාගම් පනතට ඇතුළත් කිරීම. • සමාගම් රෙජිස්ට්‍රාර් විසින් භාවිතා කරන දැනට පවතින ආකෘති පත්‍ර සරල කිරීම.
<u>බංකොලොත්භාවය විසඳීම</u> • නව බංකොලොත් නීතියක් කෙටුම්පත් කිරීම	
<u>එක්-නැවතුම්-ඒකකයක්</u> <u>හරහා ඉදිකිරීම් බලපත්‍ර</u> • ඉදිකිරීම් බලපත්‍ර නිකුත් කිරීමට අදාළ ආයතන 27ක් සම්බන්ධ කරමින් නාගරික සංවර්ධන අධිකාරියෙහි ස්ථාපිත එක් නැවතුම් ඒකකය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීම.	<u>මූල්‍ය උපකරණ සඳහා වැඩි ප්‍රවේශයක් ලබා දීම</u> • ණය ලබා ගැනීම සඳහා ව්‍යාපාරවලට තම වංචල වත්කම් ඇපකරයක් ලෙස භාවිතා කිරීමට පහසුකම් සැලසීම සඳහා නව ආරක්ෂිත ගනුදෙනු රෙජිස්ට්‍රි නීතිය බලාත්මක කිරීම. • ණය නියාමන අධිකාරී පනත බලාත්මක කිරීම. • ක්ෂුද්‍ර, කුඩා හා මාධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට ණය ලබා ගැනීමේ ක්‍රියාපටිපාටීන් සරල කිරීම. • CRIB හි ණය තොරතුරු වල විෂය පථය, ආවරණය සහ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම.
<u>කාර්යක්ෂම වාණිජ නඩු කළමනාකරණය</u> • පද්ධති කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා කොළඹ වාණිජ මහාධිකරණ සහ දිසා අධිකරණවල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම. • ආයෝජන ආරවුල් මහාධිකරණයක් පිහිටුවීම; වාණිජ මහාධිකරණයන්හි විශේෂිත අංශයක් පිහිටුවීම, ආයෝජන ආරවුල් මහාධිකරණ පනත බලාත්මක කිරීම.	

2. වෙළඳාම් පහසුකරණය

- ප්‍රමුඛතා වෙළඳ පහසුකරණ සංරචක ක්‍රියාත්මක කිරීමේදී මාස තුනකට (03) වරක් ජාතික වෙළඳ පහසුකරණ කමිටුවේ (NTFC) කාර්ය සාධනය දැඩි ලෙස සමාලෝචනය කිරීම.

- කඩිනම් ක්‍රියාවට නැංවීම සඳහා වෙළඳ පහසුකම් ක්‍රියාකාරී සැලැස්මේ ක්‍රියාකාරකම් නැවත ප්‍රමුඛතා කිරීම.

- මධ්‍ය කාලීනව ජාතික තනි කවුළුව (NSW) පිහිටුවීම - ජාත්‍යන්තර වෙළඳ කටයුතු වලදී දේශසීමා වෙළඳ ප්‍රවාහයන් මත ලේඛන සහ දත්ත අවශ්‍යතා ඉදිරිපත් කිරීම සඳහා ක්‍රියාත්මක බහු වේදිකා තනි පිවිසුම් ස්ථානයකට ගෙන එනු ලැබේ - 2023 සිට NSW ක්‍රමානුකූලව ක්‍රියාත්මක කිරීම ආරම්භ කිරීමට නියමිතය.

- ඉලෙක්ට්‍රොනික ගෙවීම් ක්‍රමයක් හඳුන්වාදීම - ප්‍රධාන පාර්ශ්වකරුවන් සමඟ එක්ව සංකල්ප පත්‍රිකාවක්/මූලික සැකැස්මක් සකස් කිරීම සහ මාර්ගෝපදේශ සකස් කිරීම තාක්ෂණ අමාත්‍යාංශය මගින් සිදු කෙරේ.

3. ශ්‍රම වෙළෙඳපොළ ප්‍රතිසංස්කරණ

- සේවා යෝජක-සේවක කොටස් සහ ආර්ථිකය යන දෙඅංශයටම ප්‍රතිලාභ සැලසෙන පරිදි නව, යාවත්කාලීන සහ ඒකාබද්ධ කම්කරු නීතියක් බලාත්මක කිරීම.

- පුද්ගලික අංශයේ සේවකයින් සඳහා සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට ඉඩ සලසන 1980 අංක 46 දරන සේවක භාර අරමුදල් පනත සංශෝධනය කිරීම.

4. වෙළඳ ලිබරල්කරණය සහ වෙළඳපල ප්‍රවේශය වැඩි දියුණු කිරීම

දේශීය ආර්ථිකය පුනර්ජීවනය කිරීමේ රජයේ ආර්ථික ප්‍රතිසංස්කරණ වැඩසටහනේ වැදගත් අංගයක් ලෙස අපනයනය ඉලක්ක කරගත් සෘජු විදේශ ආයෝජන වැඩි දියුණු කිරීම සඳහා කලාපීය සහ ගෝලීය සැපයුම් දාමයන් වෙත ප්‍රවේශ වීම සහ ගෝලීය ආර්ථිකය සමඟ නැවත සම්බන්ධ වීම රජය විසින් ඉලක්ක කර සිටී. එහි දී,

- පවතින අන්තර්ජාතික වෙළෙඳ බාධක අඩු කිරීම- වසර 3ක් ඇතුළත ආනයන CESS බදු ඉවත් කිරීම සහ වරාය හා ගුවන් තොටුපොල බද්ද (PAL) 2023 සිට වසර 5ක් ඇතුළත ඉවත් කිරීම. මෙහි පළමු අදියර ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත, 1979 අංක 40 දරන නියෝග අංක 2325/06 2023.03.28 දිනැති ගැසට් පත්‍රය සහ 2023.04.03 දිනැති අංක 2326/02 දරන PAL ගැසට් පත්‍රය මඟින් ක්‍රියාත්මක කර ඇත.

- ඇමරිකා එක්සත් ජනපදයේ සහ යුරෝපයේ ප්‍රධාන අපනයන වෙළෙඳපොළ වෙත තවදුරටත් විහිද යන අතරම, අපනයන ඉහළ නැංවීම සඳහා විශාල සහ නැඟී එන ආර්ථිකයන් ඉලක්ක කර ගනිමින් පුළුල් නිදහස් වෙළෙඳ ගිවිසුම් ඇති කර ගැනීමේ උත්සාහයක රජය නිරත වී සිටින්නේ එබැවිනි. මේ සඳහා ජාතික වෙළඳ සාකච්ඡා කමිටුවක් පිහිටුවීමට රජය පියවර ගෙන ඇති අතර මෙම කමිටුවේ ප්‍රධාන කාර්යය වන්නේ විශාල සෘජු විදේශ ආයෝජන ඇති ඉන්දියාව, චීනය සහ තායිලන්තය යන වෙළෙඳපොළ සඳහා උපායමාර්ගික වැදගත්කමක් ඇති නිදහස් වෙළඳ ගිවිසුම් පිළිබඳ සාකච්ඡා නැවත පණ ගැන්වීමයි.

- ඒ අනුව, උපායමාර්ගික වශයෙන් වැදගත් රටවල් තුනක් සමඟ නිදහස් වෙළඳ ගිවිසුම් සාකච්ඡා නැවත ආරම්භ කිරීම - තායිලන්තය සමඟ 5 වන සාකච්ඡා වටය 2023 ජූනි මාසයේදී පැවැත්වීමට නියමිත අතර, චීනය සමඟ නිදහස් වෙළඳ ගිවිසුම (FTA) පිළිබඳ සාකච්ඡාවන්හි 7 වන වටය 2023 මැයි මාසයේදී අතථ්‍ය රැස්වීම පැවැත්වීමෙන් පසු නැවත ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ, ඉන්දියාව සමඟ සාකච්ඡා කරන ලද ආර්ථික හා තාක්ෂණික සහයෝගිතා ගිවිසුමෙහි (ETCA) 12 වන සාකච්ඡා වටය ආරම්භ කිරීම ද සිදුවනු ඇත.

- ජනාධිපති කාර්යාලයේ මඟ පෙන්වීම සහිතව වෙළඳ අමාත්‍යාංශය, මුදල් අමාත්‍යාංශය, විදේශ කටයුතු අමාත්‍යාංශය, වාණිජ දෙපාර්තමේන්තුව, වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව යනාදී ආයතන නියෝජනයෙන් මෙම කටයුතු සිදුවන අතර ඊට සමගාමීව විවිධ වෙළෙඳ / කර්මාන්ත මණ්ඩල හා සංවිධාන ඇතුළු පාර්ශව කරුවන් දැනුවත් කිරීම ද සිදුවනු ඇත.

වසර ගණනාවක් පුරා ශ්‍රී ලංකාවට අදාළව ධන වෙළෙඳ ශේෂයක් ඇති බංග්ලාදේශය සමඟ වෙළෙඳ සබඳතාව ගැඹුරු කිරීම පිණිස යෝජිත බංග්ලාදේශ - ශ්‍රී ලංකා වරණීය වෙළෙඳ ගිවිසුම සම්බන්ධයෙන් සාකච්ඡා වට තුනක් දැනටමත් පවත්වා ඇති අතර එහි සිව්වැනි වටය 2023 මැයි මාසයේදී පැවැත්වීමට නියමිතය.

රජයේ සමස්ත දැක්ම වන්නේ ගෝලීය ජනගහනයෙන් 30% ක් ආවරණය වන කලාපීය විස්තීර්ණ ආර්ථික සහයෝගිතාවය (RCEP) වෙත ප්‍රවේශ වීම සහ එහි සාමාජික රටවල වෙළඳපල ප්‍රවේශය අප රටේ අපනයන සඳහා විවෘත කිරීමයි. මෙම ගිවිසුමට අවතීර්ණ වීම පිළිබඳ විස්තර ලබා ගැනීමෙන් අතුරුව සවිස්තරාත්මක පූර්ව තක්සේරුවක් / අධ්‍යයනයක් සිදු කරනු ඇත.

5. නව අධ්‍යාපනික ගතිකත්වයන් හඳුන්වාදීම

- නව ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් හඳුන්වා දීම - අධ්‍යාපන ක්‍රමයේ අවශ්‍ය පරිවර්තනයන් හඳුනා ගෙන ඒ සඳහා කෙටි, මධ්‍ය හා දිගුකාලීන අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හඳුනා ගැනීමට හැකිවන පරිදි ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය සැකසීම සඳහා කැබිනට් කමිටුවක් පිහිටුවන ලදී. මාස තුනක් තුළ දී එම ප්‍රතිපත්තිය පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කෙරෙනු ඇත.

- නිපුණතා අංශයේ ආයතන සහ ව්‍යාත්තීය සුදුසුකම් රාමුව ප්‍රතිනිර්මාණය කිරීම; රටේ ව්‍යාත්තීය නිපුණතා සහ පුහුණු ආකෘතියේ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ප්‍රතිසංස්කරණ නිර්දේශ කිරීම පෞද්ගලික අංශයේ නියෝජිතයන් ද ඇතුළු විශේෂඥ කමිටුවක් විසින් සිදු කරනු ඇත.

- විශේෂඥ කමිටුවක් මඟින් රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනවල දායකත්වයෙන් වෛද්‍ය, ඉංජිනේරු හා තාක්ෂණ යන විෂයධාරාවලින් වාර්ෂිකව නිපදවනු ලබන උපාධිධාරීන් සංඛ්‍යාව දෙගුණයක් කිරීම සඳහා අවශ්‍ය සැලැස්මක් ඉදිරිපත් කිරීමට කටයුතු සිදු කරමින් සිටී.

- COP27 දේශගුණික සමුළුවේ දී ජනාධිපතිතුමා විසින් යෝජනා කරන ලද පරිදි "දේශගුණික ක්‍රියාකාරී සැලසුම් ක්‍රියාත්මක කිරීමේදී ඇති වන බාධා මැඩපැවැත්වීම සඳහා" මාලදිවයිනේ අනුබද්ධ ආයතනයක් සමඟ ජාත්‍යන්තර දේශගුණික විපර්යාස විශ්ව විද්‍යාලයක් පිහිටුවීම - සංකල්ප පත්‍රිකාවක් සකස් කර ඇති අතර විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හරහා කොරියාවේ EXIM බැංකුවෙන් මූල්‍ය ආධාර බලාපොරොත්තු වේ.

4) සියලු ජන කණ්ඩායම්වල සමාජමය අන්තර්ගතභාවය (Social Inclusiveness) සහතික කිරීම

1. විවිධ කණ්ඩායම් අතර සම්මුතීන් ගොඩනැගීම

- පාර්ලිමේන්තුව තුළ ජාතික සභාව පිහිටුවීම; ඒ ඒ දේශපාලන පක්ෂවලින් පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීවරුන්ගෙන් සමන්විත ජාතික සභාව නමින් පාර්ලිමේන්තු කාරක සභාව පිහිටුවීම 2022.09.20 දින පාර්ලිමේන්තුවේ දී සම්මත විය. මෙමගින් කෙටි, මධ්‍යකාලීන හා දිගුකාලීන ප්‍රතිපත්ති සම්පාදනය සඳහා මඟ පෙන්වීම සහ ආර්ථික ස්ථායීකරණය අරභයා ක්‍රියාත්මක වන වැඩසටහන්වල දී සහාය දීමයි.

- සිදු කළ යුතු සමාජ හා දේශපාලන ප්‍රතිසංස්කරණ තීරණය කිරීම සඳහා ජන සභාව පිහිටුවීම.

- විදේශයන්හි වෙසෙන ශ්‍රී ලාංකික ජනතාව සමඟ සමීපව කටයුතු කිරීමට සහ ශ්‍රී ලංකාවේ ප්‍රතිසංවර්ධනය සඳහා ඔවුන්ගේ සහය ලබා ගැනීමට විදේශගත ශ්‍රී ලාංකිකයන්ගේ කටයුතු සඳහා වූ කාර්යාලයක් (OOSLA) පිහිටුවීම. කාර්යාලය විධිමත් ලෙස ස්ථාපිත කර ඇති අතර, දූත මණ්ඩල 62 න් තනතුරු 35 කම කේන්ද්‍රස්ථාන පත් කර වැඩ ආරම්භ කර ඇත.

- ජාතික සභාවේ පාර්ලිමේන්තු අනුකමිටුව විසින් තීරණය කරන ලද පරිදි ජනාධිපති ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් යුත් ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් විසින් ජාතික ප්‍රතිපත්ති කොමිෂන් සභාවක් පිහිටුවීම පිළිබඳ කෙටුම්පත් කමිටු වාර්තාවක් සකස් කර සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වෙත ඉදිරිපත් කර ඇත. පනත් කෙටුම්පත සකස් කිරීම සඳහා සංකල්ප පත්‍රිකාවක් කැබිනට් අනුමැතිය සඳහා නුදුරේදීම ඉදිරිපත් කිරීමට නියමිතයි.

- සත්‍යය හා ප්‍රතිසන්ධාන යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීම සහ කොමිෂන් සභාව පිහිටුවීම - ජනාධිපතිතුමා, අග්‍රාමාත්‍යතුමා සහ විදේශ කටයුතු, අධිකරණ, ධීවර, අධ්‍යාපන සහ නාගරික සංවර්ධන අමාත්‍යවරු ඒකාබද්ධව ඉදිරිපත් කරන ලද අමාත්‍ය සංදේශයට අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා දී ඇත. අදාළ පනත ක්‍රියාත්මක වනතුරු අතුරු ලේකම් කාර්යාලයක් පිහිටුවනු ඇත.

- යොවුන් පාර්ලිමේන්තු පනත හඳුන්වාදීම; ජාතික යොවුන් පාර්ලිමේන්තු පනත කෙටුම්පත කැබිනට් අනුමැතිය සඳහා ඉදිරිපත් කෙරේ. අමාත්‍යාංශ මට්ටමින් කමිටුවක් පත් කර ඇති අතර නව කෙටුම්පත මැයි මාසයේදී කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කිරීමට නියමිතයි.

ජනතාවගේ පරමාධිපත්‍ය බලය ප්‍රමුඛත්වයෙහිලා ක්‍රියාත්මක වන ජනතාවට වගකියන ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණයක් සිදු කිරීම පිළිබඳව අවධානය යොමුකරමින් ජනතාවට වැඩි බලයක් ලබාදෙන 21 වැනි ව්‍යවස්ථා සංශෝධනය 2022.10.31 දින සිට බලාත්මක කිරීමට පියවර ගෙන ඇත. විසි එක් වැනි සියවසට අවශ්‍ය සමාජ ආර්ථික හා දේශපාලන වෙනස්කම් සාකච්ඡා කරමින් තරුණ පරපුරට වැඩි වැඩියෙන් පාර්ලිමේන්තුවට පැමිණීමට ඉඩකඩ සැලසෙන අලුත් ආකල්පවලින් සමන්විත අලුත් ව්‍යවස්ථාවක් නිර්මාණය කිරීම ප්‍රමුඛතම කාර්යයක් වශයෙන් සලකා වත්මන් රජය තවදුරටත් කටයුතු කරනු ලැබේ.

භෞතික සම්පත් වඩා ඵලදායී ලෙස පරිභෝජනය කිරීම තුළින් රටේ සෑම ස්ථානයක්ම නවීන මානව ජනාවාස වලට සුදුසු ස්ථානයක් බවට පත් කිරීමේ දී, දේපළ අයිතිය නිසි පරිදි පවරා දීම වැදගත් කාරණයකි. ඒ අනුව, රජයේ බලපත්‍ර ඉඩම්ලාභීන්ට සින්නක්කර ඔප්පු ලබාදීම සහ රජයේ මහල් නිවාසවල ජීවත්වන අයට නිවාස අයිතිය ලබාදීම කඩිනම් කිරීම සඳහා වත්මන් රජය විසින් පියවර ගෙන ඇත.

2. සමාජ ආරක්ෂණ ජාලය ශක්තිමත් කිරීම

නව සුභසාධන ප්‍රතිලාභ ගෙවීමේ ක්‍රමය ක්‍රියාත්මක කිරීම සහ සුභසාධන ප්‍රතිලාභ ගෙවීම සඳහා අඩු ආදායම්ලාභී පවුල් හඳුනා ගැනීම සඳහා නව සුදුසුකම් නිර්ණායක යෙදීම. - ප්‍රතිලාභීන් සඳහා යෝජිත සුභසාධන ප්‍රතිලාභ ගෙවීමේ ක්‍රමය සඳහා 2023.04.17 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇති අතර එය 2023.04.21 දිනැති අංක 2328/13 ගැසට් නිවේදනයේ ද ප්‍රකාශයට පත් කර ඇත. මෙම කාර්යය නිම කිරීමත් සමඟ සුභසාධන වැඩසටහන් වඩා හොඳින් ඉලක්ක කර ප්‍රතිලාභීන්ගේ බැංකු ගිණුම් (විද්‍යුත් පද්ධති භාවිතයෙන්) වෙත මුදල් මාරු කිරීම් සෘජුවම සිදු කෙරේ. දැනට සුභසාධන ප්‍රතිලාභ මණ්ඩලය මෙම කාර්යය සම්පූර්ණ කිරීමට කටයුතු කරමින් සිටී.

3. විශේෂ අවශ්‍යතා සහිත ජන කණ්ඩායම් බල ගැන්වීම

- ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් සුරැකීමේ පනත; පළමු කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක වෙත යවා ඇත. මීට අමතරව ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතියට අනුකූලව සුදුසු පනත් කෙටුම්පතක් කෙටුම්පත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇති අතර හඳුනාගත් අඩුපාඩුකම් ද එමඟින් ආවරණය වනු ඇත.

- උතුරු සහ නැගෙනහිර පළාත් සඳහා 21 වැනි සියවසේ සමාජ-ආර්ථික සංවර්ධන අවශ්‍යතා සලකා බලමින් නව සංවර්ධන සැලැස්මක් ක්‍රියාත්මක කිරීම.

- ගොවීන් 170,000කට විශ්‍රාම වැටුප් ලබාදීම ; 2023.12.31 දිනට පෙර කටයුතු අවසන් කිරීම.

- වී ගොවීන් ලක්ෂ 9කට රසායනික හා කාබනික පොහොර සඳහා සහනාධාර ලබාදීම ; යල සහ මහ කන්නවල පොහොර අවශ්‍යතාවය සපුරාලීම සඳහා.

- උඩරට දෙමළ ජනතාව සහ වතුකරය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කර ඵලදායී වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම.

4. ආහාර සුරක්ෂිතතා වැඩසටහන

- පහත සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ජනාධිපති ලේකම් කාර්යාලයේ ආහාර සුරක්ෂිතතා වැඩසටහන 2022.07.23 දින ආරම්භ කර ඇත.

  i. රටතුළ කුසගින්න තුරන් කිරීම සහතික කිරීම.
  ii. රටෙහි ශූන්‍ය මන්දපෝෂණයක් සහතික කිරීම.
  iii. ජාතියේ ආහාර සුරක්ෂිතතාව සහ පෝෂණය සහතික කිරීම සඳහා අදාළ සියලුම පාර්ශ්වකරුවන් සම්බන්ධීකරණය කිරීම සඳහා ප්‍රමුඛ ආයතනය ලෙස ක්‍රියා කිරීම.

- බහු අංශ ඒකාබද්ධ යාන්ත්‍රණයක් පිහිටුවීම; ආර්ථික පුනර්ජීවනය සඳහා ග්‍රාමීය ආර්ථික පුනර්ජීවන මධ්‍යස්ථාන 14,000ක්, ප්‍රාදේශීය ඒකාබද්ධ යාන්ත්‍රණ 342ක්, දිස්ත්‍රික් ඒකාබද්ධ යාන්ත්‍රණ 25ක් සහ පළාත් ඒකාබද්ධ යාන්ත්‍රණ 9ක් ස්ථාපිත කර ඇත.

- මාර්ගගත ආහාර සුරක්ෂිතතා දත්ත ගබඩාව සංවර්ධනය කිරීම; “Food Gate Online Digital App” ICTA, Microsoft Sri Lanka සහ Orel Corporation සමඟ එක්ව සංවර්ධනය කර ඇත. දත්ත රැස් කිරීමේ ක්‍රියාවලිය සිදු වෙමින් පවතින අතර 2023.04.26 දිනට කුටුම්භ 295,000ක දත්ත රැස් කර ඇත.

- නියමිත වේලාවට කෘෂිකාර්මික යෙදවුම් සහතික කිරීම සඳහා පහසුකම් සැලසීම; ගොවීන්ට දැරිය හැකි මිලකට කෘෂි යෙදවුම් ලබා ගැනීම සහතික කිරීම සඳහා පොහොර, කෘෂි රසායන, බීජ සහ රෝපණ ද්‍රව්‍ය ආනයනකරුවන්, ශ්‍රී ලංකා මහ බැංකුව, වාණිජ බැංකු සහ අනෙකුත් අදාළ රාජ්‍ය ආයතන සමඟ අඛණ්ඩ රැස්වීම් පැවැත්වීම.

- පොහොර ක්‍රමෝපාය සකස් කිරීම; කාබනික සහ අකාබනික පොහොර භාවිතය ප්‍රශස්ත කිරීම සඳහා පොහොර කාර්ය සාධක බලකාය පිහිටුවා ඇති අතර සාකච්ඡා වට ගණනාවක් පවත්වා ඇත. උපායමාර්ගය කෙටුම්පත් කර ඇති අතර 2023 යල කන්නය සඳහා වන අතුරු නිර්දේශ අමාත්‍ය මණ්ඩල අනුමැතිය සහිතව ක්‍රියාත්මක කර ඇත.

- ආහාර සුරක්ෂිතතා පනත;ආහාර සුරක්ෂිතතා පනත් කෙටුම්පත කෙටුම්පත් කර ඇති අතර එය සමාලෝචනය කිරීම සඳහා තාක්ෂණික ක්‍රියාකාරී කණ්ඩායම පිහිටුවා ඇත.

- ජාතික ආහාර සුරක්ෂිතතා උපාය මාර්ගය සහ ක්‍රියාකාරී සැලැස්ම; විද්‍යාඥයින් 200කගේ ජාලයක් හරහා ජාතික විද්‍යා පදනම සමඟ විෂය පර්ෂද 17ක් පිහිටුවා ඇති අතර පොකුරු වාර්තා 3ක් කෙටුම්පත් කර ඇත.

5. ළමුන්ගේ සහ කාන්තාවන්ගේ අවශ්‍යතා සපුරාලීම

- ළමුන්ගේ ආරක්ෂාව පිළිබඳ අධ්‍යයනය කර නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා කමිටුවක් පත් කර ඇති අතර වාර්තාව 2023 සැප්තැම්බර් මාසය වන විට ඉදිරිපත් කිරීමට නියමිතය.

- නව නීති හඳුන්වා දීම සඳහා නිසි පියවර ගැනීම

i. ළමා අයිතිවාසිකම් පිළිබඳ පනත: පවතින විධිවිධාන සහ හිඳැස් හඳුනා ගැනීම සඳහා කමිටුවක් පත්කර ඇති අතර නිර්දේශ වාර්තාවක් සකස් කර ඇත.
ii. කැපකරු රැකවරණය සඳහා වන පනත; පළමු කෙටුම්පත සම්පූර්ණ කර ඇත. බහු පාර්ශ්වකරුවන්ගේ උපදේශන සලකා බැලීමෙන් අනතුරුව සුදුසු යෙදවුම් ලබා ගැනීම සඳහා පළාත් සභා වෙත ඉදිරිපත් කර ඇත.
iii. 2023 ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ කාන්තා සවිබල ගැන්වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සකස් කර ඇත.
iv. කාන්තා පනත පිළිබඳ ජාතික කොමිෂන් සභාව: අවසන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට නියමිතය.
v. ස්ත්‍රී පුරුෂ සමානාත්මතා පනත සහ පාර්ලිමේන්තු කාන්තා බල මණ්ඩලය.
vi. කාන්තා සවිබල ගැන්වීමේ පනත

අවිධිමත් ගෘහාශ්‍රිත ව්‍යාපාරවල යෙදී සිටින තරුණ කාන්තා ව්‍යවසායකයින් දිරිගැන්වීමේ වැදගත්කම හඳුනා ගනිමින් ණය යෝජනා ක්‍රමයක් සකස් කෙරේ. දැනට ව්‍යාපෘති යෝජනාව ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.

ඊ.එම්.එස්.බී. ඒකනායක
ජනාධිපති ලේකම්

03 පරිච්ඡේදය

2022.12.31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒසිඒ-එෆ්

2022.12.31 දිනෙන් අවසන් වූ කාල සීමාව සඳහා වන මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

රු.

අයවැය 2022		සටහන	තත්‍ය 2022	තත්‍ය 2021	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසිඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		2,574,459,000	2,201,900,000	ඒසිඒ-3
-	නැන්පතු		12,913,576	17,124,173	ඒසිඒ-4
-	අත්තිකාරම් ගිණුම්		35,227,637	33,266,825	ඒසිඒ-5
-	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-		
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		2,622,600,213	2,252,290,998	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		2,622,600,213	2,252,290,998	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)			-	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		2,622,600,213	2,252,290,998	
	අඩුකළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**		-	-	
666,024,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	661,982,621	550,303,045	
1,555,446,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	1,334,804,539	1,130,544,896	ඒසිඒ-2 (ii)
199,836,113	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	196,594,606	217,593,494	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
2,421,306,113	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		2,193,381,767	1,898,441,435	
	මූලධන වියදම්				
372,679,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	348,995,333	249,833,679	
149,885,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	149,143,452	154,988,009	
500,000	ප්‍රාග්ධන මාරුකිරීම්	12	195,458	1,771,880	ඒසිඒ-2 (ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	
594,000	හැකිය වර්ධනය	14	394,000	1,971,144	
100,000,000	වෙනත් මූලධන වියදම්	15	40,214,031	160,161,952	
623,658,000	**මුළු මූලධන වියදම් (උ)**		538,942,274	568,726,664	
	නැන්පතු ගෙවීම්		9,041,587	313,006,654	ඒසිඒ-4
	අත්තිකාරම් ගෙවීම්		57,418,735	29,825,756	ඒසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්			-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		66,460,322	342,832,410	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		2,798,784,363	2,810,000,509	
3,044,964,113	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		(176,184,150)	(557,709,511)	
	අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		(176,184,150)	(557,709,511)	ඒසිඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	ඒසිඒ-3
			(0)	-	

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තත්‍ය 2022 රු.	2021 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	41,798,206,152	41,683,995,416
කල්බදු ආයෝජන		89,541,533	172,002,368
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	97,035,503	74,844,405
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	-
මුළු වත්කම්		41,984,783,188	41,930,842,189
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		85,096,134	66,777,025
දේපළ පිරියත හා උපකරණ සංචිතය		41,798,206,152	41,683,995,416
කල්බදු වගකීම		89,541,533	172,002,368
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ-5(බී)		-
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	11,939,369	8,067,380
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	-
මුළු වගකීම්		41,984,783,188	41,930,842,189

පිටු අංක 11 සිට 67 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 68 සිට 107 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අපොසුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
නම :	නම :	අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
තනතුර :	තනතුර :	නම :
දිනය : 2023.02. 17	දිනය : 2023.02. 17	දිනය : 2023.02.16
පී එම් එස් බී ඒකනායක ජනාධිපති ලේකම් ජනාධිපති කාර්යාලය කොළඹ 01	පී එම් එස් බී ඒකනායක ජනාධිපති ලේකම් ජනාධිපති කාර්යාලය කොළඹ 01	ආචාර්ය තාරක ලියනපතිරණ ප්‍රධාන මූල්‍ය නිලධාරි ජනාධිපති කාර්යාලය කොළඹ 01

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-සී

2022.12.31 දිනට මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

	තත්‍ය	
	2022 රු.	2021 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්		
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර		
ලාභ		
ආදායම් නොවන ලැබීම්		
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	23,119,158	327,209,847
අග්‍රිම ලැබීම්	2,574,459,000	2,201,900,000
අත්තිකාරම් අයකර ගැනීම්	61,515,365	29,035,052
තැන්පතු ලැබීම්	12,913,626	17,124,173
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් (අ)	2,672,007,149	2,575,269,072
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	1,867,021,543	1,646,818,458
සහනාධාර සහ මාරුකිරීම්	190,689,573	201,152,487
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	48,265,983	3,190,797
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	-	-
අත්තිකාරම් ගෙවීම්	58,054,750	29,825,756
තැන්පතු ගෙවීම්	9,041,637	313,006,654
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	2,173,073,486	2,193,994,152
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ) = (අ)-(ආ)	498,933,662	381,274,920
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
නිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	498,933,662	381,274,920
ප්‍රවාහය (ඉ)	498,933,662	381,274,920
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ) = (ඇ)-(ඉ)	(498,933,662)	(381,274,920)
මෙහෙයුම් හ ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ)+(ඊ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහයන් (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.4 මූල්‍ය ප්‍රකාශ සඳහා වන සටහන් :

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය: අදාළ නැත

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කරගැනීමේ කාර්ය සාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන්කරන ලද ප්‍රතිපාදන (රුපියල්)		සත්‍ය වියදම (රුපියල්)	උපයෝගී කරගනු ලැබූ ප්‍රතිපාදන අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	2,477,900,000	2,421,306,113	2,193,287,408	91
මූලධන	566,520,000	623,658,000	539,036,633	86

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		සත්‍ය වියදම	උපයෝගී කරගන්නා ලද ප්‍රතිපාදන, ලබාදුන් ප්‍රතිපාදනවල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
1	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව	ණය ශේෂ නිරවුල් කිරීමට	938,677.61	938,677.61	938,677.61	100
2	රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය	ජනාධිපති කාර්යාලය වෙත අනුයුක්ත කරන ලද සංවර්ධන නිලධාරීන් හා අභ්‍යාසලාභී උපාධිධාරීන් හට ගෙවීම් කිරීම සඳහා	20,860,316.90	20,860,316.90	16,853,450.67	80.79
3	අධ්‍යාපන අමාත්‍යාංශය	ස්ථානමාරු වී පැමිණි නිලධාරියෙකුගේ නිහඳීමනා ගෙවීම සඳහා	17,551.39	17,551.39	17,551.39	100.00

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2022 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2022 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය (රු:)	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය ලෙස % වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්		1,120,083,876.16		
9152	යන්ත්‍රෝපකරණ		4,713,690,299.89		
9153	ඉඩම්		35,541,525,000.00		
9154	අස්පෘෂ්‍ය වත්කම්		493,350.00		
9155	ජීව විද්‍යාත්මක වත්කම්		-		
9160	කෙරීගෙන යන වැඩ		83,910,900.71		
9180	බදු දෙන ලද වත්කම්		338,502,725.40		
			41,798,206,152.16		

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE



මගේ අංකය / எனது இல. / My No. } TPD/C/PO/22/FA/01

ඔබේ අංකය / உமது இல. / Your No. }



දිනය / திகதி / Date } 2023 මැයි 31 දින

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී
ජනාධිපති කාර්යාලය

ශීර්ෂය - 001 ජනාධිපති කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශීර්ෂය - 001 ජනාධිපති කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජනාධිපති කාර්යාලය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී ඉදිරිපත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

ජනාධිපති කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ජනාධිපති කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි

අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී .

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී .

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වන බවට මා ප්‍රකාශ කරමි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 අඟුම් කළමනාකරණය

2022 වර්ෂයේ වාර්ෂික ඇස්තමේන්තු ප්‍රතිපාදනය රු.3,044,420,000 ක් වුවද, ජනාධිපති කාර්යාලය විසින් සැලසුම් කරන ලද අඟුම් ඉල්ලීම රු.2,803,180,000 ක් විය. එහෙත් භාණ්ඩාගාරයෙන් රු.5,457,268,000 ක අඟුම් ඉල්ලුම් කර තිබුණු අතර එය සැලසුම් කළ අඟුම් වටිනාකමට වඩා ඉල්ලුම් කළ අඟුමය මාසිකව සියයට 2 සිට සියයට 304 දක්වා පරාසයකින් වැඩිවී තිබුණි.

2.2 වියදම් කළමනාකරණය

2.2.1 ඇස්තමේන්තු පිළියෙල කිරීම

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 18ක ප්‍රමාණවත් පරිදි වාර්ෂික ඇස්තමේන්තු ප්‍රතිපාදන සලසා නොගැනීම නිසා මුල් ප්‍රතිපාදනයෙන් සියයට 25 සිට 760 දක්වා ප්‍රමාණයක් මුදල් රෙගුලාසි 66/99 මඟින් මාරු කර ගෙන එකතුව රු.448,132,000 ක ප්‍රතිපාදන වැඩිකරගෙන තිබුණි.

(ආ) වැය විෂයයන් 02 ක එකතුව රු.20,000,000 ක අයවැය ඇස්තමේන්තුවට අමතරව මු.රෙ.66/69 යටතේ සිදු කළ මාරු කිරීම් තුළින් වැය විෂයයන් සඳහා එකතුව රු.16,925,000 කින් ප්‍රතිපාදනය වැඩිකරගෙන තිබුණ ද, වියදම රු.19,089,696 ක් වූයෙන් මූල් ඇස්තමේන්තු ප්‍රතිපාදනය හෝ වියදම් කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) වාර්ෂික ඇස්තමේන්තුවෙන් ප්‍රතිපාදන වෙන්කරගෙන නොතිබූ වැය විෂයයන් දෙකක් සඳහා පරිපූරක ඇස්තමේන්තු හා මු.රෙ.66/69 මඟින් ප්‍රතිපාදන සලසා ගෙන එකතුව රු.6,791,948 ක වියදම් දරා තිබුණි.

2.2.2 ප්‍රතිපාදන උපයෝජනය කිරීම

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් දෙකක පිළිවෙලින් රු.1,000,000 ක හා රු.300,000 ක ශුද්ධ ප්‍රතිපාදනය සමාලෝචිත වර්ෂය තුළදී කිසිදු වැය කිරීමකින් තොරව සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි.

(ආ) වැය විෂයයක් සඳහා වාර්ෂික ඇස්තමේන්තුවෙන් වෙන්කර තිබූ රු.100,000 ක මුළු ප්‍රතිපාදනයම මුදල් රෙගුලාසි 66 මඟින් වෙනත් වැය විෂයකට මාරු කර තිබුණි.

(ඇ) වැය විෂයයන් 12 ක එකතු වටිනාකම රු.388,396,000 ක් වූ ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් සියයට 33 සිට සියයට 93 ත් අතර ප්‍රමාණයක ප්‍රතිපාදන වෙනත් වැය විෂයයන් සඳහා මුදල් රෙගුලාසි 66/69 මඟින් මාරු කර තිබුණි.

2.3 බැඳීම් හා බැරකම්

මු.රෙ. 94(i) ප්‍රකාරව වෙනත් ආකාරයකට විධිවිධාන සලසා ඇති අවස්ථාවල දී හැර වාර්ෂික ඇස්තමේන්තුවල ඒ සඳහා මුදල් ප්‍රතිපාදන ඇත්නම් විනා කිසිම දෙපාර්තමේන්තුවක් විසින් වැඩක් හෝ සේවයක් හෝ සැපයුමක් සඳහා කිසිම වියදමකට හෝ බැඳීමකට හෝ නොබැඳී සිටිය යුතු බව සඳහන් වුව ද, එවැනි තහවුරු කර ගැනීමකින් තොරව වර්ෂයේ ප්‍රතිපාදන ඉක්මවා ජනාධිපති ලේකම් කාර්යාලයේ වැය විෂයයන් දෙකක එකතු වූ රු.520,714 ක් ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට එළඹ තිබුණි.

2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කිරීම, සේවයේ නියුතු සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම කාර්යසාධන ගිවිසුම් අත්සන් කිරීම, සෑම සාමාජිකයෙකු සඳහාම අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ලබාදීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම හා ඒ පිළිබඳ කටයුතු කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කර එම නිලධාරියාට ඉහත කටයුතු පැවරීම චක්‍රලේඛය ප්‍රකාරව සිදු කර නොතිබුණි.
(ආ) මු.රෙ. 110 ප්‍රකාරව	හානි පිළිබඳ ලේඛනයක් යාවත්කාලීනව පවත්වාගෙන නොතිබුණි.

(ඇ) මු.රෙ. 396 (ඇ)	නිකුත් කර මාස 06 ක් ඉක්ම වූ නමුත් ගෙවීමට ඉදිරිපත් නොකළ එකතුව රු.216,078 ක් වටිනා චෙක්පත් 04ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
(ඈ) මු.රෙ.880, 891(1) හා 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයට අනුව මුදල් රෙගුලාසි 315(1)	ඇප තැබිය යුතු නිලධාරීන්ගෙන් ඇප ලබාගැනීමට කටයුතු කර නොතිබුණු අතර, ඇප තැබීමට අවශ්‍ය සියළුම නිලධාරීන්ගේ නම් ඇතුළත් ඇප ලේඛනයක්, එක් එක් දෙපාර්තමේන්තුවෙහි ප්‍රධාන කාර්යාලයේ වඩාත් මැනවින් වූ අකාරාදි ක්‍රමයට පිළියෙල කොට පවත්වාගෙන යා යුතු වුවත් ජනාධිපති කාර්යාලයේ ඇප ලේඛනයක් පවත්වා නොතිබුණි.

2.5 තත්කාර්යය අතුරු අග්‍රිම නිකුත් කිරීම හා පියවීම

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අපේක්ෂිත වියදම වඩාත් නිවැරදිව හඳුනාගෙන ඇස්තමේන්තු නොකිරීම හේතුවෙන් අවස්ථා 42 කදී එකතුව රු.4,537,000 ක තත්කාර්යය අතුරු අග්‍රිම ලබාගෙන කාර්යය නිමවීමෙන් පසුව එකතුව රු.1,878,493 ක් මුදලින් ආපසු පියවා තිබුණ අතර, එය ලබාගත් අත්තිකාරම් මුදලින් සියයට 41.4 ක් බව නිරීක්ෂණය විය.

(ආ) ශ්‍රී ලංකා ආණ්ඩුවේ මුදල් රෙගුලාසි 371 (4) පරිදි නිශ්චිත හා අවශ්‍ය නොවන කාර්යයන් සඳහා අතුරු අග්‍රිම ලබා නොගත යුතු වුවද, අවස්ථා 19 කදී එකතුව රු.1,464,120 ක අග්‍රිම මුදලක් ලබාගෙන එම මුදල කිසිදු කාර්යයකට යොදා ගැනීමෙන් තොරව දින 1 සිට 43ක් අතර කාලයක් අත රඳවාගෙන මුළු අත්තිකාරම් මුදලම නැවත මුදලින් පියවා තිබුණි. ඒ අතරින් මුදලින් ලබාගත් රු.50,000 ක අත්තිකාරම් මුදලක් චෙක්පතක් මඟින් පියවා තිබුණු බව ද විගණනයට නිරීක්ෂණය විය.

2.6 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම

මේ සම්බන්ධයෙන් කරන ලද විගණන පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) මිය ගිය නිලධාරියකුගේ වර්ෂ 4-5 අතර කාලයක සිට හිඟව පවතින පිළිවෙලින් ආපදා ණය රු.99,140 ක් හා උත්සව අත්තිකාරම් රු.8,000 ක් වශයෙන් එකතුව රු.107,140 ක ණය මුදලක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අය වී නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) අවුරුදු 05 කට වැඩි කාලයක් සිට පැවත එන විශ්‍රාම ගිය නිලධාරීන් දෙදෙනෙකුගේ අය වීමට ඇති පිළිවෙලින් රු. 144,768 ක දේපල ණය ශේෂයක් හා රු.114,655ක ආපදා ණය ශේෂයක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අයනොවී පැවතුණි.

(ඇ) වර්ෂ තුනත් පහත් අතර කාලයක සිට වැඩ තහනම් කරන ලද නිලධාරීන් තිදෙනෙකුට අදාළ එකතුව රු.257,927 ක අය නොවී පවතින ආපදා ණය ශේෂයන් සමාලෝචිත වර්ෂය අවසන් වන විට අයවී නොතිබුණි.

(ඈ) සේවය අතහැර ගොස් ඇති නිලධාරීන් 10 දෙනෙකුගෙන් මාස 3, වසර 1ත් 5ත් අතර හා වසර 5 ට වැඩි කාලයක සිට අය නොවී පවතින එකතුව රු.1,054,444 ක හිඟ ණය ශේෂ සමාලෝචිත වර්ෂය අවසානය වන විට අයවී නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

3.1.1 ක්‍රියාකාරී සැලැස්ම

අංක 02/2020 හා 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තම ආයතනය වෙනුවෙන් අනුමත වාර්ෂික අයවැය ඇස්තමේන්තු ක්‍රියාත්මක කිරීම සඳහා නියමිත මුදල් වර්ෂය වෙනුවෙන්, අදාළ වර්ෂයට යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සේවයේ සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු, අනුමත අයවැය පදනම් කරගත් ප්‍රමුඛතා අනුව සකස් කළ ක්‍රියාකාරකම් සැලැස්ම, ක්‍රියාත්මක කාල රාමුව හා එම ක්‍රියාකාරකම්වල අපේක්ෂිත නිමවුම්/ ප්‍රතිඵල, වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක් මුදල් අවශ්‍යතා සැලැස්ම, අභ්‍යන්තර විගණන සැලැස්ම යනාදී කරුණු ඇතුළත් කර වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වුවද සමාලෝචිත වර්ෂය සඳහා චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාර ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

3.1.2 ප්‍රසම්පාදන සැලැස්ම

අංක 02/2020 හා 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදය යටතේ නිකුත් කර ඇති මාර්ගෝපදේශ අංක 13 ප්‍රකාරව ප්‍රසම්පාදන කටයුතු සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්හි සඳහන් විධිවිධාන අනුගමනය කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය සඳහා මූලධන වන්කම් අත්පත් කර ගැනීම වෙනුවෙන් වාර්ෂික අයවැය මඟින් වෙන් කළ රු.176,920,000 ක ප්‍රතිපාදනයෙන් රු.149,143,452 ක් වියදම් කර තිබුණ ද, ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණ බව නිරීක්ෂණය විය.

3.1.3 කාර්යභාරයන් ඉටු කිරීම

ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබීම හේතුවෙන් ආයතනයේ කාර්යසාධනය පරීක්ෂා කිරීමට නොහැකි විය.

3.2 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර තිබූ ACA – 6 මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ 2022 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂයට රු.47,529,618 ක මූල්‍ය නොවන වත්කම් එකතු කර තිබුණ ද, එම වටිනාකම සනාථ කර ගැනීමට විස්තරයක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) වෙනත් රාජ්‍ය ආයතන හා විභාරස්ථාන වෙත මූදාහැර ඇති වාහන 116 ක ලියාපදිංචි අයිතිය නිරාකරණය කර ගැනීම සඳහා ලිපි ලේඛන වර්ෂයකට පෙර දී භාර දී ඇති නමුත් 2023 අප්‍රේල් මාසය දක්වා ලියාපදිංචි අයිතිය පවරා දී නොතිබුණි.

(ඇ) භෞතික පැවැත්ම අනාවරණය කර ගැනීමට නොහැකි ජනාධිපති ලේකම් කාර්යාලයට අයත් වාහන 51 ක් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා පැවැත්ම තහවුරු කර ගැනීමට අසමත් වී තිබුණි. මෙම වාහනවල වටිනාකමක් හෝ සොයා ගැනීමට නොහැකි වී තිබුණි.

(ඈ) අපහරණය කිරීමට කටයුතු කෙරෙමින් පවතින වාහන 24 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අපහරණය කර ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) ජනාධිපති කාර්යාලයට අයත් වාහන 28 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් රක්ෂණය කර නොතිබුණි. ඉහත වාහන අතුරින් වාහන 13ක් අධි ආරක්ෂිත රථ බැවින් පිරිවැය සලකා රක්ෂණය කර නොමැති බව සඳහන් කර තිබුණි. මෙම වාහන 13 හි වටිනාකම සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් තක්සේරු කර නොතිබුණි.

(ඊ) විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව, ජනාධිපති කාර්යාලය විසින් තාවකාලික පදනම මත වෙනත් රාජ්‍ය ආයතන සතු වාහන 52 ක් ලබාගත් බව දන්වා එවා තිබුණද, වාහන 66 ක් භාවිතා කරන බව විගණනයේදී නිරීක්ෂණය විය. විස්තර නොමැතිවීම හේතුවෙන් ඇතැම් වාහන සඳහා ජනාධිපති කාර්යාලයට ලබාගත් දිනය ද සොයාගත නොහැකි වී තිබුණි. මෙම වාහන සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.28,802,245 ක් නඩත්තු වියදම ලෙස ජනාධිපති කාර්යාලය විසින් ගෙවා තිබුණි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ඒ) රජයේ වෙනත් ආයතනවල අරමුණු හා පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා කාර්යාලය සතු වාහන වෙනත් ආයතන හා පුද්ගලයින් වෙත ලබා දී තිබුණ ද, එසේ ලබා දීමේදී ආයතනයේ අරමුණු ඉටුකිරීමට බාධාවක් නොවන පරිදි හා දේපලේ ආරක්ෂාව තහවුරු වන පරිදි විධිමත් අනුමැතියකින්, විධිමත් ක්‍රමවේදයකට වාහන පවරාදීමට කටයුතු කළ යුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි. පවරා දුන් වාහන වලින් වාහන 12 ක් වාහනය නිදහස් කළ දිනය දක්වා නොතිබුණි. ජනාධිපති කාර්යාලය සතු වාහන 53 ක් වෙනත් රාජ්‍ය ආයතන, විහාරස්ථාන, ආගමික නායකයින් හා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වෙත නිදහස් කර තිබුණි. එම වාහන අතරින් වාහන 27 ක් සඳහා සමාලෝචිත වර්ෂය තුළදී රු.13,695,119 ක් නඩත්තු වියදම් දරා තිබුණ ද එම වියදම් ප්‍රතිපූර්ණය කර ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

3.3 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව 2022 වර්ෂයේදී ඇති වූ කලබලකාරී වාතාවරණය තුළදී ජනාධිපති ලේකම් කාර්යාලය හා කොටුව ජනාධිපති මන්දිරයේ භාණ්ඩ හා උපකරණ සහ වාහනවලට සිදුවී ඇති විගණිත දිනට තක්සේරු කර තිබුණු අලාභහානිවල එකතු වටිනාකම වූ රු.36,675,854 ක් බව නිරීක්ෂණය වූ අතර එය මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයෙහි හෙළිදරව් කර නොතිබුණි.

(ආ) පැවති කලබලකාරී වාතාවරණය තුළ වාහන 22කට අලාභහානි සිදුවී තිබුණ ද එම වාහන වලින් වාහන 6ක් 2023 මාර්තු 31 දින වන විටත් අළුත්වැඩියා කර නොතිබුණි.

(ඇ) 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ මු.රෙ.109 යටතේ වන පොතෙන් කපා හැරීම් හා අයකර ගැනීම් පිළිබඳ ප්‍රකාශනයට අනුව 2014 සිට 2022 කාල පරිච්ඡේදයට අදාළව රු.25,000ට අඩු වාහන අනතුරු සිද්ධි 51ක් සහ රු.25,000ට වැඩි වාහන අනතුරු සිද්ධි 279ක් සම්බන්ධයෙන් කටයුතු අවසන්වී නොතිබීමේ හේතුවෙන් තවදුරටත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙනයමින් පැවතුණි. උක්ත වාහන 279 අතරින් වාහන 235 ක තක්සේරුගත අලාභ වටිනාකම එකතුව රු.54,442,331 ක් වූ අතර වාහන 44 ක අලාභය මේ දක්වා ගණනය කර නොතිබුණි.

බී.ඕ.ඩී. ප්‍රනාන්දු
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

04 පරිච්ඡේදය

ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

ක්‍රියාකාරකම් / අයිතම	කාර්යසාධන දර්ශකය	සත්‍ය නිමැවුම (%) (අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් ලෙස)		
		100 - 90	89- 75	74 - 50
ජනාධිපති කාර්යමණ්ඩල ප්‍රධානී අංශය				
ජාතික ප්‍රතිපත්ති සකස් කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය මැදිහත්වීම් සහ මඟපෙන්වීම.	සිදු කල මැදිහත්වීම් සංඛ්‍යාව	√		
ගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන්/ ජනාධිපති ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් හා ජනාධිපති කාර්යමණ්ඩල ප්‍රධානීතුමන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන රැස්වීම් හා සාකච්ඡා ඵලදායී ලෙස පැවැත්වීම තහවුරු කිරීම, සම්බන්ධීකරණය හා එහිදී ගනු ලබන තීරණ පසුවිපරම් කිරීම.	පවත්වනු ලබන රැස්වීම් සංඛ්‍යාව සකස් කරන ලද රැස්වීම් සටහන් සංඛ්‍යාව පසුවිපරම් කල තීරණ සංඛ්‍යාව	√ √ √		
ජනාධිපති කාර්යාලය වෙත ලැබෙන විශේෂ අවධානය යොමු කළ යුතු ලිපි, විද්‍යුත් තැපැල් පණිවුඩ, දුරකතන ඇමතුම්, ෆැක්ස් පණිවුඩ හා වට්ස්ඇප් (WhatsApp) මඟින් ලැබෙන විවිධාකාර ඉල්ලීම් පිළිබඳව නිසි පියවර ගැනීම හා පසුවිපරම.	පසුවිපරම් කල ලිපි/ ඉල්ලීම් සංඛ්‍යාව	√		
විශේෂ ව්‍යාපෘති අංශය				
ආණ්ඩු පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු, ගරු ආණ්ඩුකාරවරු, පළාත් සභා නියෝජිතයින්, පළාත් පාලන ආයතන ප්‍රධානීන් හා මන්ත්‍රීවරු, පක්ෂයේ සංවිධායකවරු, අනුබද්ධ සංවිධාන සාමාජිකයන්, වෘත්තිය සමිති නියෝජිතයින්, සමාජිකයින් හා ජනාධිපති කාර්යාලය අතර සම්බන්ධීකරණය සිදු කිරීම.	සිදුකළ සම්බන්ධීකරණයන් සංඛ්‍යාව	√		
ඉදිරිපත් වන ඉල්ලීම්, යෝජනා හා ගැටළු ගරු ජනාධිපතිතුමා වෙත හා අදාළ පාර්ශව වෙතින් නියමිත නිලධාරීන් වෙත යොමු කිරීම	සිදු කරනු ලබන මැදිහත් වීම් සංඛ්‍යාව ලබා දෙන විසඳුම් ප්‍රමාණය	√		

ක්‍රියාකාරකම් / අයිතම	කාර්යසාධන දර්ශකය	සත්‍ය නිමැවුම (%) (අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් ලෙස)		
		100 - 90	89- 75	74 - 50
විශේෂ ව්‍යාපෘති අංශය (තව දුරටත්)				
ගරුතර ස්වාමීන් වහන්සේලාගේ ඉල්ලීම් , යෝජනා හා ගැටළු සම්බන්ධයෙන් විසඳුම් ලබාදීමට අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.	සිදුකළ සම්බන්ධීකරණයන් සංඛ්‍යාව	√		
ගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන උත්සව, රැස්වීම් හා සාකච්ඡා එළදායි ලෙස පැවැත්වීමට අදාළව දේශපාලන අධිකාරිය සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම	උත්සව, රැස්වීම් හා සාකච්ඡා පවත්වනු ලැබූ සංඛ්‍යාව	√		
ගරු ජනාධිපතිතුමන් ලබා දෙන උපදෙස් නියෝග හා මඟපෙන්වීම් අදාළ දේශපාලන අධිකාරිය වෙත යොමු කිරීම	යොමු කළනියෝගයන් හා උපදෙස් ප්‍රමාණය	√		
ලැබෙන නියෝගයන් පරිදි මහජන උද්ඝෝෂණ හා විරෝධතා පිළිබඳව සොයා බලා එම ගැටළු සම්බන්ධයෙන් වාර්තා සකසා ගරු ජනාධිපතිතුමාගේ අවධානයට යොමු කිරීම	ඉදිරිපත් කළ වාර්තා සංඛ්‍යාව	100%		
